# (ඒ) විදේශීය වෙළෙඳාම

## හැඳින්වීම

විදේශීය වෙළෙඳාම පිළිබඳ පහත සඳහන් ඡේදයන්ට මූල පිරීමේදී යම්කිසි වසරක් තුළ නියම ආනයන අපනයන සංචලනයෙහි, ඇති සැටි දක්වන්නාවූත්, අර්ථවත්වූත්, දර්ශකයන් වශයෙන් රේගු වෙළෙඳ සංඛ්‍යා තොරතුරුවල, විශේෂයෙන් ආනයන සංඛ්‍යා තොරතුරු වල ඇති සත්‍යතාවය පිළිබඳව අවවාදාත්මකව වචනයක් කිව යුතුය. 1963 සහ 1964සඳහා වූ වාර්ෂික වාර්තාවල දක්වා ඇති පරිදි, ආනයන භාණ්ඩ රේගුවෙන් ඉවත් කිරීමත්, ඒ බව රේගු වාර්තාවල ලේඛන ගතවීමත් අතර කාල පරතරයක් ඇතිවිය හැකිවීම නිසා ඇත්ත වශයෙන් ආනයනය කළ භාණ්ඩ යන්ගේ වටිනාකමෙහිත් එම කාලසීමාව තුළ රේගුවෙන් ඉවත් කළ බවට වාර්තාවල සඳහන් වන භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත්වෙනසක් ඇතිවිය හැක. මේ සලකා බැලීම විශේෂයෙන් රාජ්‍ය අංශයේ ආනයනවලටත්, ඒවායිනුත් විශේෂයෙන්ම මුළු ආනයන වලින් සැලකිය යුතු සමානුපාතයක්වන සහල්, තිරිඟු පිටි හා සීනි වලටත් අදාල වෙයි.

රේගු සංඛ්‍යා තොරතුරු වලට අනුව, 1965 ආනයන රුපියල් කෝටි 147·4 ක් නොහොත් ඉකුත් වසරේ සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 50·1 කින් අඩුවූ බවක් දක්වෙයි: එකී වර්ෂයේ මුළු ආනයන වටිනාකම වන රුපියල් කෝටි 191·6 සමග සසඳන කල (විනිමය පාලන වාර්තා වලින් පිළිබිඹු වන පරිදි) කිසියම් වර්ෂයක භාණ්ඩ සංචලනය හා ඒවාට අදාල ගෙවුම් සම්බන්ධයෙන් සටහන් කිරීමේදී ඇතිවන වෙනස්කම් හා පමාවීම් වලට වැඩිම ප්‍රමාණයක් ඉඩහල ද, මෙය බොහෝ සෙයින්ම පහත් වටිනාකමෙකි. අවසාන වශයෙන් ප්‍රතිශෝධිත, 1965 හේ විදේශීය විනිමය අයවැය ලේඛනයෙන් රුපියල් කෝටි 197·0 ක ආනයන සඳහා ඉඩ සලසා ඇත. මේ වර්ෂය තුළදී ආනයන කරන ලද භාණ්ඩයන්ගේ මුළු වටිනාකම, රේගු සංඛ්‍යා තොරතුරු වලින් සඳහන් වී ඇත්තේ ඉතාමත් අඩුවෙන් බැව් පැහැදිලිය. පහත දක්වෙන ඡේදයන්ගෙන් විස්තර වන පරිදි, ආහාර කොමසාරිස්ගේ ආනයන වලට, එනම් සහල්, තිරිඟු පිටි හා සීනි වලට පමණක් අදාලවූ අඩුවෙන් තක්සේරු කිරීම රුපියල් කෝටි 24·8 ක් විය. රුපියල් කෝටි 147·4 ක වටිනාකමක් දක්වූ පහත සඳහන් වන මුළු ආනයනයන් පිළිබඳ අර්ථ නිරූපනය කිරීමේදී මෙම වෙනස පිළිබඳව යෝග්‍ය ඉඩ හැරීමකින් යුතුව එසේ කළ යුතුවෙයි.

දැන් පවත්නා රේගු ක්‍රියාමාර්ග වලට අනුව, පෞද්ගලික ආනයන කරුවන්ගේ නැව්බඩු තොග වරායට ගෙන ආ පසු, ඔවුන්ගේ ආනයනයන් පිළිබඳව හැකි ඉක්මනින් රේගු ලේඛනවල සටහන් තැබීමට එකී ආනයන කරුවන් බැඳී සිටිති. සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ සහ අනෙකුත් රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල ආනයන ද ඇතුලත් වන ආහාර කොමසාරිස්වරයාගේ ආනයනයන්ට අතිරේක වූ රාජ්‍ය අංශයේ ආනයන රටෙහි මුළු ආනයනයන්හි ලා වඩාත් වැදගත් වනවාත් සමගම, මෙකී ආනයනයන් පිළිබඳව රේගුවේ වාර්තා තැබීමද දැනට පවත්නා ක්‍රියා මාර්ගයන් යටතේ පෞද්ගලිව ආනයන කරුවන් විසින් රේගු ලේඛනවල සටහන් තැබිය යුතු වේගයෙන්ම සිදු කිරීමට වග බලා ගැනීමද ඉතාමත්

වැදගත් වෙයි. මේ සලකා බැලීම රජයේ අපනයන වලටද (එම ප්‍රශ්නය එතරම් උග්‍ර නොවන බැව් පිළිගෙන තිබෙන නමුදු) විශේෂයෙන්ම ද්‍රව්‍ය මිලට ගැනීම් කොමසාරිස්ගේ රබර් නැව් තොග අපනයනයන්ටද අදාල වෙයි. එහෙත් එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා මේ ක්‍රියා මාර්ගයන් නිසි පරිදි දැඩිව නොයෙදුව හොත්, රටේ විදේශීය වෙළෙඳම ප්‍රමාණවත් පරිදි අගැයීමෙහිලා අත්‍යාවශ්‍ය වන භාණ්ඩ සංචලනයේ හා ඒවාට අදල ගෙවුම් ඉතා කිට්ටු ප්‍රමාණයකින් දක්වීමට රේගු සංඛ්‍යා වලට හැකි නොවෙයි.

**පොදු ලක්ෂණ**

රේගු වාර්තාවෙන් දක්වෙන අයුරු ලංකාවේ විදේශීය වෙළෙඳම පිළිබඳ සම්පූර්ණ විස්තර II (එ) 1 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

සංඛ්‍යා සටහන II (එ) 1

**විදේශීය වෙළෙඳම 1959 – 1965**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | ආනයනවල තුබූ අපනයන අනුපාතයෙහි සියයට ගණන |
|---|---|---|---|---|
| | අපනයන * (නැ. වි. ස.) | ආනයන (මි. ර. ගැ.) | වෙළෙඳ ශේෂය | |
| 1959 .. | 1,754 | 2,005 | —251 | 87 |
| 1960 .. | 1,832 | 1,960 | —128 | 93 |
| 1961 .. | 1,733 | 1,703 | + 30 | 102 |
| 1962 .. | 1,808 | 1,660 | +148 | 109 |
| 1963 .. | 1,731 | 1,490 | +241 | 116 |
| 1964 .. | 1,876 | 1,975 | — 99 | 95 |
| 1965 .. | 1,949 | 1,474 | +475 | 132 |

සංඛ්‍යා: රේගු වාර්තා වලිනි

* ප්‍රති අපනයන ඇතුළුව

1965 දී ලංකාවේ අපනයන වටිනාකම රුපියල් කෝටි 7·3 කින් හෙවත් සියයට 4 කින් වැඩිවිය. 1964 දී එහි වැඩිවීම රුපියල් කෝටි 14·5 ක් හෙවත් සියයට 8 ක් විය. 1964 තුළදී රුපියල් කෝටි 48·5 ක හෙවත් සියයට 33 ක තියුණු ප්‍රසාරණයක් දක්වූ ආනයන වටිනාකම ඉකුත් වර්ෂයේ[1] සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 50·1 කින් හෙවත් සියයට 25 කින් අඩුවී රුපියල් කෝටි 147·4 හි, පැවතින. 1964 තුළදී රුපියල් කෝටි 9·9 ක අවාසියක් දක්වූ වෙළෙඳ ශේෂය රේගු වාර්තාවල සඳහන් වන පරිදි රුපියල් කෝටි 47·5 ක අතිරික්තයක් වාර්තා කරයි. පසුගිය වර්ෂයේ 95 ක්ව පැවති ආනයන අපනයන අනුපාතය 132 දක්වා වේගයෙන් ඉහළ නැංගේය.

1964 වර්ෂය තුළදී කොළඹ වරායේ නැව් බඩු පැටවීම හා ගොඩබෑම අතින් දියුණුවක් ලබා තුබූ බව එම වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් විය. 1965 වූ කලී මේ වරායේ තත්ත්වයෙහි දියුණුව තවත් දුරට කැපී පෙනුන වසරකි. මේ වසර තුළදී වරායට ඇතුළු වූ නැව් සංඛ්‍යාව සියයට 9 කින් වැඩි වුවද, බඩු බා එකී නැව් ආපසු වරායෙන් පිටවීම ද සැලකියුතු වැය වේගයකින් සිදුවිනි. වරායේ රැඳී සිටි සාමාන්‍ය කාලසීමාව 1964 දී දින 14·6 ක් විය. එය 1965 දී දින 10·1 දක්වා පහළ

1. ඉහත දක්වෙන හැඳින්වීම කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

වැටුනෙන් සියයට 31 ක දියුණුවක් දක්වීය[1]. වරායෙහිදී ගොඩබාන ලද හා නැව්ගත කරන ලද භාණ්ඩ පිරිවැටුමෙහිද ප්‍රසාරණයක් ඇතිවිය. අපනයන භාණ්ඩ, නැව් ටොන් 67,025 කින් හෙවත් පසුගිය වසරට වඩා සියයට 11 කින් ද ආනයන භාණ්ඩ, නැව් ටොන් 81,124 කින් හෙවත් පසුගිය වසරට වඩා සියයට 4 කින් ද වැඩිවිය[2].

මෙම දියුණුව හේතුකොට ගෙන, නැව් සමාගම් සංවිධානය, කොළඹදී ගොඩබෑම සඳහා නැව්ගත කරන ලද භාණ්ඩයන් සඳහා වූ නැව්කුළී අධිමිල වර්ෂය තුළදී අඩුකොට, අවසානයේදී මුළුමනින්ම ඉවත් කර දමන ලදී[3]. වර්ෂය අවසානයේදී අධිමිල සම්පූර්ණයෙන්ම ඉවත් කෙළෙන් කොළඹ වරාය 1958 දී ජාතිය සතු වීමෙන් පසු පළමු වරට අධිමිලෙන් නිදහස් වරායක් විය.

---

1. 1964 හා 1965 වර්ෂයන්හිදී කොළඹ වරායට පැමිණි නැව් පිළිබඳ විස්තර සැසඳීමෙක් පහත දක්වෙයි:-

**1964 හා 1965 වර්ෂ තුළදී පැමිණි සාමාන්‍ය බඩු නැව්**

| වර්ෂය | නැව් ගණන | එක් නැවක් පැමිණි වේලේ සිට වැඩ අරඹන තෙක්, වරාය තුළ නවතා තුබූ සාමාන්‍ය කාලසීමාව (දින) | එක් නැවක් බඩු බා අවසාන කිරීමට සාමාන්‍යයෙන් ගත වූ කාලසීමාව (දින) | එක් නැවක් රැඳී සිටි සාමාන්‍ය කාලසීමාව (දින) |
|---|---|---|---|---|
| 1964 | 462 | 4·6 | 10· | 14·6 |
| 1965 | 504 | 2·04 | 8·03 | 10·07 |

සංඛ්‍යා: වරාය (නැව් බඩු) සංස්ථාව.

2. මේ වසරේ එක් එක් කාර්තුව තුළ දී හා 1964 වසරේ එම කාර්තුව තුළ දී කොළඹ වරාය යෙහිදී පටවන ලද හා ගොඩබාන ලද ටොන් ප්‍රමාණය පිළිබඳ විස්තර සැසඳීමක් පහත දක්වෙයි.

**බඩු ආනයන හා අපනයන**

| | 1964 | 1965 | නියම | නැව් ටොන් වෙනස % |
|---|---|---|---|---|
| 1 වැනි කාර්තුව | 6,50,674 | 6,53·191 | + 2,517 | + 0·4 |
| 2 වැනි කාර්තුව | 6,90,937 | 7,88,349 | + 97,412 | + 14·1 |
| 3 වැනි කාර්තුව | 7,19,905 | 7,24,864 | + 4,959 | + 0·7 |
| 4 වැනි කාර්තුව | 6,66,126 | 7,09,387 | + 43,261 | + 6·5 |
| වර්ෂය | 27,27,642 | 28,75,791 | + 1,48,149 | + 5·4 |

සංඛ්‍යා: වරාය (නැව්බඩු) සංස්ථාව.

3. පහත දක්වෙනුයේ එම අධිමිල අඩු කිරීම පිළිබඳ විස්තරයයි:

(i) **එක්සත් රාජධානිය හා මහාද්වීපය/කොළඹ නැව් සමාගම් සංවිධානය.**

1965 ජනවාරි 1 – අධිමිල සියයට 20 දක්වා අඩු කරන ලදී.
1965 අප්‍රේල් 1 – අධිමිල සියයට 30 දක්වා වැඩි කරන ලදී.
1995 ජූනි 1 – අධිමිල සියයට 20 දක්වා අඩු කරන ලදී.
1965 සැප්තැම්බර් 6 – අධිමිල සියයට 12½ දක්වා අඩු කරන ලදී.
1965 ඔක්තෝබර් 25 – අධිමිල මුළුමනින්ම ඉවත් කරන ලදී.

(ii) **ඕස්ට්‍රේලියාව/කොළඹ නැව් සමාගම් සංවිධානය.**

1965 අගෝස්තු 1 – අධිමිල සියයට 20 දක්වා අඩු කරන ලදී.
1965 ඔක්තෝබර් 1 – අධිමිල සියයට 12½ දක්වා අඩු කරන ලදී.
1965 නොවැම්බර් 9 – අධිමිල මුළුමනින්ම ඉවත් කරන ලදී.

(iii) **නවසීලන්තය/කොළඹ නැව් සමාගම් සංවිධානය.**

1965 සැප්තැම්බර් 3 – කොළඹ වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා සියයට 20 දක්වා ද, ත්‍රිකුණාමලය වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා සියයට 10 දක්වා ද අධිමිල අඩු කරන ලදී.
1965 ඔක්තෝබර් 6 – කොළඹ වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා සියයට 12½ දක්වා ද, ත්‍රිකුණාමල වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා සියයට 5 දක්වා ද අධිමිල අඩු කරන ලදී.
1965 දෙසැම්බර් 1 – අධිමිල මුළුමනින්ම ඉවත් කරන ලදී.

(iv) **ඇ. එ ජ./ඉන්දියාව, පකිස්ථානය, ලංකාව සහ බුරුම නැව් සමාගම් සංවිධානය**

1965 ජූලි 7 – අධිමිල සියයට 30 දක්වා අඩු කරන ලදී.
1965 ඔක්තෝබර් 8 – අධිමිල සියයට 20 දක්වා අඩු කරක ලදී.
1965 නොවැම්බර් 4 – අධිමිල මුළුමනින්ම ඉවත් කරන ලදී.

(v) **ජපානය කොළඹ නැව් සමාගම සංවිධානය.**

1965 පෙබරවාරි 15 – අධිමිල සියයට 20 දක්වා වැඩි කරන ලදී
1965 දෙසැම්බර් 1 – අධිමිල සියයට 10 දක්වා අඩු කරන ලදී.
1966 ජනවාරි 1 – අධිමිල මුළුමනින්ම ඉවත් කරන ලදී.

II (එ) 2 සංඛ්‍යා සටහන අපනයන සැකසුම පෙන්නුම් කරයි.

සංඛ්‍යා සටහන II (එ) 2

**අපනයනන සැකැසුම**

| භාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | | | මුළු අපනයන වලින් සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| තේ .. .. | 1096 | 1115 | 1149 | 1140 | 1142 | 1210 | 60 | 64 | 64 | 66 | 61 | 62 |
| රබර් .. .. | 378 | 260 | 290 | 257 | 290 | 304 | 21 | 15 | 16 | 15 | 15 | 16 |
| ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන .. | 184 | 202 | 227 | 198 | 273 | 275 | 10 | 12 | 13 | 11 | 15 | 14 |
| අනෙකුත් දේශීය අපනයන .. | 117 | 104 | 100 | 110 | 137 | 127 | 6 | 6 | 5 | 6 | 7 | 6 |
| මුළු දේශීය අපනයන .. | 1775 | 1681 | 1766 | 1705 | 1842 | 1916 | 97 | 97 | 98 | 98 | 98 | 98 |
| ප්‍රති අපනයන .. | 57 | 52 | 42 | 26 | 34 | 33 | 3 | 3 | 2 | 2 | 2 | 2 |
| එකතුව .. | 1832 | 1733 | 1808 | 1731 | 1876 | 1949 | 100 | 100 | 100 | 100 | 100 | 100 |

සංඛ්‍යා: රේගු වාර්තාවලිනි.

අපනයන ආදායම රුපියල් කෝටි 7·3 කින් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ මුළු අපනයන පරිමාවෙහි වැඩිවීමෙකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අපනයන පරිමා දර්ශකය 125 දක්වා, එනම් සියයට 5 කින් වැඩි වීමක් දක්විය.! ඉකුත් තුන් වසර තුළ සාමාන්‍ය අපනයන මිලෙහි වෙනසක් ඇති නොවිය. එම කාලසීමාව තුළදී 93 ක්ව පැවති බැංකුවේ අපනයන මිල දර්ශකය සියයට 2 ක සුළු වැඩිවීමක් දක්වාලීය.

අපනයන ආදායමෙහි මෙකී වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ තේ අපනයන වලින් ලැබුන අදායම රුපියල් කෝටි 6·8 කින් හෙවත් සියයට 6 කින් වැඩිවීමය. තේ අපනයනයන් නිසා වූ ලැබීම් වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ අපනයනය කළ පරිමාවෙහි සියයට 9 ක තියුණු වැඩිවීමෙකි. තේ රාත්තලක නෑ. වි. ස. මිල රු. 2·45 ක් වූයේ රාත්තලක මිල සියයට 6 කින් පහළ වැටිණ. මුළු අපනයන අදායමෙහි, තේ වලට අයත් කොටස සියයට 62 ක් වූයෙන් එය ඉකුත් වසර අභිබවා ඇත්තේ සුළු ප්‍රමාණයෙකිනි.

රබර් වලින් ලැබුන ආදායම රුපියල් කෝටි 1·4 කින් හෙවත් සියයට 5 කින් වැඩිවිය. තේ වල මෙන්, මෙකී ආදායම්වල වැඩිවීමට ද මුළුමනින්ම හේතු වූයේ අපනයන පරිමාව සියයට 6 කින් වැඩි වීමය. රු. 1.14 ක් වූ රබර් රාත්තලක සාමාන්‍ය නෑ. වි. ස. මිල පසුගිය වසරට වඩා සියයට 1 ක පහත වැටීමෙක් දක්විය. මුළු අපනයන ආදායමෙහි රබර් වලට අයත් කොටස සියයට 16 කින් හෙවත්, පසුගිය වසර අභිබවා සුළු ප්‍රමාණයකින් වැඩිවිය.

මුළු අපනයන ආදායම වැඩිකිරීමෙහි ලා ප්‍රධාන නිෂ්පාදිත තුනෙන් ලැබුන රුකුල ඉතාමත් සුළු විය. එම වැඩිවීම රුපියල් කෝටි 0·2 ක් හෙවත් සියයට 1 ක් විය. මේ නිෂ්පාදිතයන්හි මුළු අපනයන පරිමාවෙහි ඇති වූ සියයට 22 ක තියුණු සංකෝචනය, ඒවායේ සාමාන්‍ය නෑ. වි. ස. මිල හිතකර අයුරින් වැඩිවීමෙන් සටහන් විය. පොල් තෙල් හා කොප්පරා වල සාමාන්‍ය නෑ. වි. ස. මිල පිළිවෙලින් සියයට 27 කින් හා සියයට 25කින් වැඩිවූ අතර කපාපු පොල් වල මිල සියයට 34 කින් ඉහළ ගියේය. මුළු අපනයන ආදායමෙහි මෙකී නිෂ්පාදිතයට අයත් කොටස, ඉකුත් වසරෙහි දී සියයට 15 ක් වූයේ සියයට 14 දක්වා පහළ වැටිණි.

අනෙකුත් දේශීය අපනයනයන්ගේ ආදායම රුපියල් කෝටි 1 කින් හෙවත් සියයට 7 කින් පහළ වැටිණි. කුරුඳු අපනයනයන්හි වටිනාකම රුපියල් කෝටි 2·9 ක් වූයේ රුපියල් කෝටි 0·4 ක හෙවත් සියයට 16 ක වැඩිවීමෙක් දක්විය. මෙකී අපනයනයන්ගේ පරිමාවෙහි සියයට 4 ක පහළ වැටීම, ඒවායේ සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 14 කින් වැඩිවීම නිසා පමණටත් වැඩියෙන් මැකී ගියේය. කොහු කෙඳි අපනයනය රුපියල් කෝටි 5·0 ක් වූයේ රුපියල් කෝටි 0·7 කින් හෙවත් සියයට 12 කින් පහළ වැටුනේ අපනයන පරිමාව සියයට 13 කින් පහළ වැටීම නිසාය. පීරාපු කෙඳිවල සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 9 කින් පහල වැටුන අතර, මෙට්ට කොහු වල සාමාන්‍ය නැ. වි. ස මිල සියයට 14 කින් වැඩි වින. කොකෝවා අපනයන රුපියල් කෝටි 0·4 ක් වූයේ රුපියල් කෝටි 0·2 කින් හෙවත් සියයට 30 කින් පහළ වැටින. ඒවායේ පරිමාව සියයට 26 කින්ද, හොණ්ඩරයක සාමාන්‍ය නැ. වි. ස. මිල රුපියල් 157 ක් වූයේ සියයට 5 කින්ද පහළ වැටුනි. ප්‍රති අපනයනයන්ගේ වටිනාකම රුපියල් කෝටි 0·1 ක හෙවත් සියයට 3 ක පහළ වැටීමෙක් දක්විය.

රේගු සංඛ්‍යා තොරතුරු වලට අනුව වසරේ මුළු ආනයන වටිනාකම වූ රුපියල් කෝටි 147·4, රුපියල් කෝටි 50·1 ක හෙවත් සියයට 25 ක පහළ වැටීමෙක් දක්වා ඇත. එසේ වුවද, ඉහතින් වූ හැඳින්වීමෙහිදී අවධාරණයෙන්ම සඳහන් කර ඇති පරිදි, මේ මුළු ආනයන වටිනාකම මේ වසර තුළදී නියම වශයෙන් ලැබුන ආනයනයන්ගේ වටිනාකමට වඩා ඉතා අඩු වටිනාකමක් සඳහන් කරයි. නිදර්ශනයක් වශයෙන්, පාරිභෝගික භාණ්ඩ ගණයේ ආහාර පාන උප ගණයෙහි ආහාර කොමසාරිස් වරයා විසින් ආනයනය කැරුන සහල්, තිරිඟු පිටි, හා සීනි පමණක් ම රුපියල් කෝටි 5·61 වූයේ, මෙකී ද්‍රව්‍ය තුන සඳහා රේගු වාර්තාවන්හි සඳහන් වටිනාකමට වඩා රුපියල් කෝටි 24·8 ක වැඩි බවෙක් දක්විය. ඉකුත් වසර හා සසඳන කළ අන්තර් භාණ්ඩ වල පරිමාවෙහි වැඩිවීමෙක් දක්වෙයි. මෙකී ආනයනයන්ගේ පරිමාව දක්වෙන මහ බැංකු දර්ශකය 12 කින් වැඩි වූයේ 135 ක් විය.

සාමාන්‍ය ආනයන මිල 1963 හා 1964 තුළ දී පිළිවෙලින් 10 කින් හා 2 කින් වැඩි වූයේ 1965 තුළදී ද, එම ඉහළ නැගීමේ ප්‍රවනතාව නොකඩවාම පවත්වා ගත්තේය. මෙකී මිල පිළිබඳ බැංකු දර්ශකය 109 ක්ව පැවතියේ පසුගිය වසර අභිබවා 2 කින් වැඩි විය. පාරිභෝජන භාණ්ඩ මිල දර්ශකය 110 ක් වූයේ 6 කින් පහළ වැටී ඇති බවත්, අන්තර් භාණ්ඩ මිල දර්ශකය 92 ක් වූයේ වෙනසක් ඇති නොවුන බවත්, ආයෝජන භාණ්ඩ මිල දර්ශකය 132 ක් වූයේ 36 කින් තියුණු ලෙස වැඩිවී ඇති බවත්, ප්‍රධාන ආනයන ගණයන්ගේ එක් එක් දර්ශක වලින් හෙළි කැරින. පාරිභෝජන භාණ්ඩ ගණයේ උපගණ තුනෙහි ඒ ඒ දර්ශක වලට අනුව පාරිභෝජන භාණ්ඩ වල මිල පහළ වැටීම 'ආහාර පාන' හා 'අනෙකුත් පාරිභෝජන භාණ්ඩ' ගණ වලට සීමාවී ඇති බැව් දක්වේ. පිළිවෙලින් 109 ක් හා 121 ක් වූ මෙකී ගණයන්හි දර්ශක පිළිවෙලින් 7 කින් හා 8 කින් පහළ වැටීමෙක් දක්වයි. රෙදිපිළි සඳහා වූ දර්ශකය 104 ක් වූයේ 3 කින් වැඩි විය.

ලංකාවේ වෙළඳ අනුපාතය දක්වෙන දර්ශකය 1963 දී 9 කින් ද, 1964 දී 3 කින් ද, පහත වැටුනි. 1965 දී මෙම සම්බන්ධතාවයෙහි සුළු දියුණුවක් ඇති වූයේ එම දර්ශකය 89 දක්වා 2 කින් ඉහළ නැංගේය.

අපනයන.
තේ.

II - (එ) 3 සංඛ්‍යා සටහනෙහි, තේ නිෂ්පාදනය, අපනයනය හා මිල පිළිබඳ විස්තර දක්වයි.

සංඛ්‍යා සටහන II (එ) 3

## තේ නිෂ්පාදනය අපනයන සහ මිල

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන | | කොළඹ වෙන්දේසියේ රාත්තලක මිල සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ | රාත්තලක නැ.වි.ස. මිල රු. සත | උස්විම වගාව රු. සත | මැදි බිම වගාව රු. සත | පහත් බිම වගාව රු. සත | සියලු තේ වර්ග රු. සත |
| 1955 .. | 380 | 362 | 3·30 | 2·34 | 2·04 | 2·40 | 2·24 |
| 1956 .. | 376 | 348 | 3·00 | 2·50 | 1·96 | 1·88 | 2·16 |
| 1957 .. | 398 | 368 | 2·78 | 2·05 | 1·61 | 1·88 | 1·86 |
| 1958 .. | 413 | 411 | 2·75 | 2·11 | 1·51 | 1·48 | 1·73 |
| 1959 .. | 413 | 384 | 2·72 | 2·13 | 1·69 | 1·67 | 1·85 |
| 1960 .. | 435 | 410 | 2·67 | 2·03 | 1·75 | 1·83 | 1·88 |
| 1961 .. | 455 | 426 | 2·62 | 1·99 | 1·72 | 1·74 | 1·83 |
| 1962 .. | 467 | 452 | 2·54 | 2·02 | 1·61 | 1·56 | 1·75 |
| 1963 .. | 485 | 456 | 2·50 | 1·90 | 1·54 | 1·53 | 1·68 |
| 1964 .. | 482 | 456 | 2·51 | 1·93 | 1·58 | 1·49 | 1·68 |
| 1965 .. | 503 | 495 | 2·45 | 1·93 | 1·66 | 1·64 | 1·75 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තා
කොළඹ තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය
තේ පාලක තැනගේ පාලන වාර්තා

වර්ෂයේ අවසන් කාර්තුව තුළ පැවති ඉතා හිතකර කාලගුණය රුකුලක් වීම නිසා 1965 වර්ෂයේ තේ නිෂ්පාදනය මෙතාක් දක්නට ලැබූ වැඩිම නිෂ්පාදනය ඇතිවූ 1963 වසරට ද වඩා රාත්තල් කෝටි 1·8 කින් වැඩි වෙමින් රාත්තල් කෝටි 50·3 දක්වා ඉහල ගියේ මෙතෙක් නොවූ විරූ වාර්තාවක් පිහිටු විය. මෙය 1964 දීට වඩා රාත්තල් කෝටි 2·1 ක හෙවත් සියයට 4 ක වැඩි වීමෙකි. මෙකී නිෂ්පාද නය වැඩිවීමත් සමගම ආනයන පරිමාවෙහිද රාත්තල් කෝටි 3·9 ක හෙවත් සිය යට 9 ක වැඩි වීමෙක් ඇතිවිනි.

මේ වසරේදී කොළඹ තේ වෙන්දේසිය කරා පෙරට වඩා තේ තොගයක් ඇදී ආ අතර, විකුණූ ප්‍රමාණය ඉකුත් වසරට වඩා රාත්තල් කෝටි 2·2 කින් වැඩි විය. 1964 දී මෙම වෙන්දේසියේ පැවති මිලට වඩා මෙම වසරෙහි දී ලැබුණු මිල වාසි සහ ගත විය. උස් බිම් වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිල ඉකුත් වසරේ පරිදි ම නොවෙනස්ව රු. 1.93 ක්ව පැවති අතර, මැදි බිම් වගාවේ තේ රාත්තලක සාමා- න්‍ය මිල රු. 1.66 දක්වා රාත්තලක් ශත 8 කින් වැඩිවිය. ඉතාමත් තියුණු වැඩි වීමක් දක්නට ලැබුණේ පහත් බිම් වගාවේ තේ වලය. මේ වර්ගයේ තේ රාත්ත ලක සාමාන්‍ය මිල රු. 1·64 දක්වා රාත්තල සත 15 කින් වැඩි විය. මෙම මිල වැඩි වීමට ප්‍රධාන හේතුවක් වූයේ මැද පෙරදිග රටවල් විසින් තේ වැඩි ප්‍රමාණයක් මිලට ගැණීමය. සියළු තේ වර්ගයන්හි රාත්තලක සාමාන්‍ය මිල රු. 175 දක්වා රාත්තලක් සත 7 කින් වැඩිවිය. උස් බිම් වගාවේ තේ වල පසුගිය වසරේ මුල් කාර් තුවේදී වූ මිලට වඩා මෙම වසරේ එම කාර්තුවේදී සත 5 ක ඉහළ යාමක් දක්නට

ලැබිණි. දෙවැනි කාර්තුව තුල දී සාමාන්‍ය මිලෙහි දියුණුවක් දක්නට නොලැබින. එහෙත් ඉකුත් වර්ෂයේ තුන්වන කාර්තුව සමග සසදන කල මෙම වර්ෂයේ එම කාර්තුව තුළ දී රාත්තලක මිල සත 4 කින් වැඩි විය. එසේ වුවද, අවසන් කාර්තුවේදී, අස්වැන්න ප්‍රමාණය වැඩිවීමේ හේතුවෙන් වාරිකව වර්ගය පහළ වැටීමත්, සැපැයුම වැඩිවීමෙන් ඇති වූ බලපෑමත් නිසා මිල තත්ත්වය පහතට නැඹුරු වූයේ මෙකී කාර්තුව තුළ දී සාමාන්‍ය මිළ රාත්තලක් සත 12 කින් පහළ වැටිනි. මැදි බිම් වගාවේ තේ වල සාමාන්‍ය මිල උස් බිම් වගාවේ තේ මිලෙහි පොදු හැඩගැස්ම අනුගමනය කළ අතර, එම වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිළ වසරේ සැම කාර්තුවක් තුළ දීම සත 10 ක පමණ වැඩිවීමෙක් දක්විය. කෙසේ වුවද, අවසාන කාර්තුවේදී මෙම තේ වල සාමාන්‍ය මිල උස් බිම් වගාවේ තේ වල මිල අනුගමනය කරමින් රාත්තල සත 6 කින් පහළ වැටිණ. වර්ෂයේ මුල් අඩ තුළ දී පහත් බිම් වගාවේ තේ වල සාමාන්‍ය මිලෙහි, 1964 වසරේ එම කාලසීමාවේ දීට වඩා වැඩි වෙනසක් නොදක්වීය. එහෙත් වසරේ තුන් වැනි හා හතර වැනි කාර්තු වල දී මිල තියුණුව නැඟී එන්නට වූයේ ඒවායේ මිල පිළිවෙලින් රාත්තලකට සත 29 හා සත 33 බැගින් ඉහල ගියේය.

එහෙත් ලන්ඩන් තේ වෙන්දේසියේ දී ලංකා තේ වලට වාසියක් අත් නොවිනි 1965 තුළ දී මෙම වෙන්දේසියේ විකිණුනු සියළු වර්ගයන්හි ලංකා තේ වල මිළ රාත්තලක් සි. 4 පැ. 3.15 ක් වූයේ පසුගිය වසරට වඩා රාත්තලක මිල පැ. 2·74 කින් පහළ වැටිනි. 1964 දී රාත්තලකට පැ. 1·52 කින් මෙකී මිල වැඩිවී තිබුණි. උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු තේ වල රාත්තලක මිල පිළිවෙලින් පැ. 2·48 කින් හා පැ. 1·05 කින් එතරම් තියුණු නොවන පරිදි අඩුවීම, ලංකාවේ තේ මිළ පහත වැටීම සමග සිදු වුවද, තේ නිෂ්පාදනය කරන අනෙකුත් සමහර ප්‍රදේශයන්හි, එනම්, අප්‍රිකානු රටවල, මුරිසි දිවයින්, මලයාව, ආජන්ටිනාව සහ වියට්නාමයෙහි පොදු තේ වර්ගයන් හි මිල සැලකිය යුතු තරම් වාසි සහගත විය. ලන්ඩන් තේ වෙන්දේසියේ දී විකුණන ලද උතුරු ඉන්දියානු තේ ප්‍රමාණය වූ රාත්තල් කෝටි 15·7 පසුගිය වසරේ දී විකුණූ ප්‍රමාණයට වඩා වෙනසක් නොදක්වුවද, මෙකී වෙන්දේසි වල දී විකුණන ලද ලංකා තේ ප්‍රමාණය රාත්තල් කෝටි 12·0 දක්වා රාත්තල් කෝටි 0·5 කින් ඉහළ නැගුනි. මේ වසරේදී ලන්ඩන් වෙන්දේසියේ දී විකුණන ලද සියළු තේ වල රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 4 පැ. 2·17 ක් වූයේ 1964 ට වඩා රාත්තලකට පැ. 1·33 ක් අඩු විය. එක්සත් රාජධානියේ තේ තොග මට්ටම ඉහල යාමත් ( 1965 දෙසැම්බර් 31 වැනි දිනට මෙකී තොගයෙන් රාත්තල් කෝටි 15·3 ක් නොහොත්, 1964 වර්ෂය අවසානයේ දීට වඩා රාත්තල් කෝටි 3·3 කින් වැඩි විය.[1] ) 1965 තුළ දී එ රටෙහි තේ පාරිභෝජනයේ රාත්තල් කෝටි 23·5 ක ඇස්තමේන්තු ගත පහළ වැටීමක් ඇති වීමත්,[2] මේ වසරේදී ලන්ඩන් හි තේ මිළ පහළ වැටීමට හේතු වූ වැදගත් සාධකයන්ය.

1964 තුළ දී ලෝක තේ පාරිභෝජනය ලෝක තේ සැපයුමට වඩා රාත්තල් කෝටි 4·7 කින් වැඩි වී ඇති බව, ජාත්‍යන්තර තේ කමිටුවේ ඇස්තමේන්තු වලින් දක්වෙයි. 1965 සඳහා වූ කමිටුවේ ප්‍රක්ෂේපනයෙන් ලෝක සැපයුමෙහි පාරිභෝජනයට වඩා රාත්තල් කෝටි 0·7 ක අතිරික්තයක් දක්වෙයි රාත්තල් කෝටි 174·8 ක් වූ ලෝක නිෂ්පාදනයත් සමග සසඳන කල මෙය සාපේක්ෂිත වශයෙන් ඉතා සුළු ප්‍රමාණයකි.[3] මේ අනුව, ලෝක සැපයුම හා ඉල්ලුම 1965 තුළ දී ඉතා කිට්ටු සමතුලිතතාවයක පැවැතු බව පෙනී යයි. දනට ලෝක සැපයුම හා ඉල්ලුම පවත්නා දළ සමතුලනයට දැඩි ලෙසින් හානි පැමිණ විය හැකි ප්‍රමාණයකින් ලෝක නිෂ්පාද

---

1. 1966 ජනවාරි 14 වෙනි දින අංක 703 දරන ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමයේ තේ වෙළෙඳ පොළ පිළිබඳ වාර්තාව.
2. 1966 පෙබරවාරි 11 දින ඉන්වෙස්ටර්ස් ගාඩියන්, 329 වන පිටුව.
3. 1965 දෙසැම්බර් 24 වැනි දින ඉන්වෙස්ටර්ස් ගාඩියන්. 1491 වන පිටුව.

නය නුදුරු අනාගතයේ දී ප්‍රසාරණය විය හැකි බවක් නොපෙනෙන මුත්, ප්‍රධාන නිෂ්පාදක රටවල පවතින විශේෂයෙන් හිතකර වූ කාලගුණය සැපයුම වැඩි කිරීමට රුකුලක් වීමෙන් සැපයුමෙහි වැඩිවීමක් ඇතිවීම හේතු කොට ගෙන, ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි මිල කෙරෙහි බලපෑම් ඇති කර විය හැකි වෙයි. අනෙක් අතින්, නිෂ්පාදක රටවල් බොහොමයක ම වැඩිපළදාව නිසාත්, එකී රටවල නැවත වගා කිරීමේ හා වගා කිරීමේ වැඩ පිළිවෙල වල් නිසාත්, දිගු කාලීන නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් ප්‍රාසාරණය වනු ඇතැයි අපේක්ෂා කැරේ. ලෝක පරිභෝජනය ද එකී ප්‍රාසාරණයේ මට්ටමට නොපැමිණිය හොත් මිල පහළ වැටීමේ ප්‍රවනතාවය අනාගතයේ දීද නොකඩවා එලෙසින් පවතිනු ඇත.

## රබර්

II (එ) (4) සංඛ්‍යා සටහන රබර් නිෂ්පාදනය අපනයන හා මිල පිළිබඳ විස්තර දක්වයි.

සංඛ්‍යා සටහන II (එ) 4

### රබර් නිෂ්පාදනය, අපනයනය සහ මිල

| වර්ෂය | නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ | අපනයන රාත්තල් දශ ලක්ෂ | රාත්තලක නැ·වි·ස· මිල රු සත | ආර්. එස්. එස් නො 1 රබර් සඳහා කොළඹ වෙළෙඳපොළේ රාත්තලක මිල රු. සත |
|---|---|---|---|---|
| 1955 .. | 210 | 222 | 1·58 | 1·28 |
| 1956 .. | 214 | 193 | 1·52 | 1·45 |
| 1957 .. | 220 | 209 | 1·44 | 1·16 |
| 1958 .. | 224 | 207 | 1·25 | 0·93 |
| 1959 .. | 205 | 206 | 1·45 | 1·25 |
| 1960 .. | 218 | 235 | 1·61 | 1·24 |
| 1961 .. | 215 | 197 | 1·32 | 1·01 |
| 1962 .. | 229 | 224 | 1·29 | 0·98 |
| 1963 .. | 231 | 209 | 1·23 | 0·93 |
| 1964 .. | 246 | 253 | 1·15 | 0·90 |
| 1965 .. | 261 | 267 | 1·14 | 0·91 |

සංඛ්‍යා; රබර් පාලක තැනගේ පාලන වාර්තා
ලංකා රේගු වාර්තා
කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමය.

1964 වසරේ දී රබර් නිෂ්පාදනය රාත්තල් කෝටි 1·5 කින් හෙවත් සියයට 7 කින් ප්‍රාසාරණය විය. 1965 තුළ දී නිෂ්පාදනය රාත්තල් කෝටි 26·1 ක් වූයේ, පසුගිය වසරේදීට වඩා රාත්තල් කෝටි 1·5 ක හෙවත් සියයට 6 ක වැඩිවීමෙක් පිළිබිඹු විය. 1964 දී සියයට 21 කින් තියුණු ලෙස වැඩි වූ අපනයන පරිමාව, 1965 තුළ දී රාත්තල් කෝටි 26·7 ක් වූයෙන්, පසුගිය වසරට වඩා රාත්තල් කෝටි 1·4 කින් හෙවත් සියයට 6 කින් වැඩි විය. කොළඹ වෙළෙඳ පොළෙහි ආර්. එස්. එස් නො. 1 රබර් වල සාමාන්‍ය මිල සත 91 ක් වූයේ පසුගිය වසරේදීට වඩා රාත්තලකට සත යක සුළු වැඩිවීමක් දක්විය.

මිල අතින් බලන කල 1965 තුළ දී ජාත්‍යන්තර වෙළෙඳ පොළවල ස්වාභාවික රබර් මිලත්, කෘතිම රබර් මිලත් අතර දැඩි තරගයක් ඇති විත. මෙකී වෙළෙඳ පොළවල ආර්. එස්. එස්, නො. 1 රබර් මිල සුළු වශයෙන් වැඩි වූයෙන්, මීට පෙර වසරවලදී මෙකී ද්‍රව්‍යය සඳහා දිගින් දිගටම අඩු මිල ලැබීමේ ප්‍රවනතාවය බිඳී ගියේය. ආර්. එස්. එස්. නො. 1 රබර් සඳහා ලන්ඩන් වෙළෙඳ පොළේ සාමාන්‍ය මිල, 1962 සිට 1964 දක්වා වූ වර්ෂ තුල රාත්තලකට පැන්සයක් තරමින් අඩු වූ අතර,

ඉකුත් වර්ෂයේ දී රාත්තලක මිල පැන්ස 20 19/32 සිට පැන්ස 21⅓ දක්වා ඉහල නැගුණෙන් 1965 තුළ දී පැන්සයකින් පමණ රාත්තලක මිල දියුණුවිය. සිංගප්පූරු වෙළෙඳ පොලෙහි ද මෙබඳුම මිල දියුණුවක් ඇතිවූයේ, මෙම වර්ගයේ රබර් රාත්තලක නැ. වි. ස මිල සිංගප්පූරු සත 70·12 ක් විය. මෙය 1964 දීට වඩා රාත්තලකට සිංගප්පූරු සත 1·98 ක වැඩිවීමෙකි. වසර තුළ දී මෙකී දියුණුව ඇති කිරීමට විවිධ සාධකයන් හේතුවිය. මේවා අතර සෝ. ස ස. සං. යේ ආනයන වැඩිවීමත්, රන්ප වුම් අවප්‍රමාණගත කරණු ඇතැයි යන දූෂමාන ආරංචියත්, අග්නිදිග ආසියාවේ දේශපාලන අසහනයත්, ඉන්දුනීසියානු රබර් ලබාගත හැකිවේද යන්න පිළිබඳව ඇති වූ සැකයත්, වසරේ අවසාන භාගයේදී, මහජන චීන සමූහාණ්ඩුව සිංගප්පූරු වෙළෙඳ පොළට ඇතුළු වීමත් යන කරුණු විය ජාත්‍යන්තර රබර් හැදෑරුම් මූළු වෙන් ලැබී ඇති අළුත්ම ඇස්තමේන්තු අනුව , 1965 ලෝක ස්වාභාවික රබර් නිෂ්පාදනය ටොන් 22,95,000 ක් වූයේ පසුගිය වසරට වඩා ටොන් 62,500 කින් හෙවත් සියයට 3 ක වැඩිවීමෙක් දක්විය. ලෝක ස්වාභාවික රබර් පාරිභෝජනය ටොන් 23,30,000 දක්වා තරමක් වේගවත් ව, එනම්, ටොන් 1,10,000 කින් හෙවත් සියයට 5 කින් ප්‍රාසාරණය විය. එහෙත් ලෝක කෘතිම රබර් නිෂ්පාදනය හා පාරිභෝජනය ඊටත් වඩා වේගයෙන් ප්‍රාසාරණය වී ඇත. නිෂ්පාදනය ටොන් 30,20,000 ක් වූයේ, ටොන් 2,17,500 කින් හෙවත් සියයට 8 කින් වැඩි වී ඇත. ලෝක රබර් පාරිභෝජනය ටොන් 2,90,000 ක් වූයේ ටොන් 1,80,000 ක හෙවත් සියයට 7 ක වැඩිවීමෙක් දක්විය. ලෝකයේ මුළු රබර් පාරිභෝජනයේ ඇති වූ ටොන් 2,90,000 ක වැඩිවීමෙන් ටොන් 1,80,000 ක් හෙවත් සියයට 62 ක් වූ කොටස කෘතිම රබර් පාරිභෝජනයේ වැඩිවීමෙක් විය.

**පොල් නිෂ්පාදිත**

II (එ) 5 සංඛ්‍යා සටහන ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන පරිමාව හා මිල දක්වයි.

සංඛ්‍යා සටහන II (එ) 5

**ප්‍රධාන පොල් නිෂ්පාදිත අපනයන පරිමාව සහ මිල**

| වර්ෂය | පරිමාව | | | | නැ·වි·ස· මිල | | |
|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් හොණ්ඩර දහස් ගණනින් | කොප්පරා හොණ්ඩර දහස් ගණනින් | කපාපු පොල් හොණ්ඩර දහස් ගණනින් | එකතුව (නිෂ්පාදනය සඳහා වැය වූ පොල් ප්‍රමා,) ගෙඩි දශ ලක්ෂ | පොල්තෙල් ටොන් එකක මිල රු. සත | කොප්පරා පාරමක * මිල රු. සත | කපාපු පොල් රාත්තල මිල රු. සත |
| 1955 .. | 1,945 | 1,367 | 1,157 | 1,531 | 1,156·20 | 209·50 | 0·42 |
| 1956 .. | 1,698 | 1,155 | 1,275 | 1,418 | 1,168·40 | 212·15 | 0·45 |
| 1957 .. | 1,081 | 695 | 978 | 950 | 1,256·00 | 239·75 | 0·50 |
| 1958 .. | 887 | 554 | 1,135 | 890 | 1,396·00 | 264·85 | 0·57 |
| 1959 .. | 1,389 | 852 | 1,050 | 1,140 | 1,688·20 | 302·60 | 0·64 |
| 1960 .. | 1,110 | 583 | 1,099 | 976 | 1,436·60 | 276·15 | 0·58 |
| 1961 .. | 1,837 | 1,100 | 967 | 1,355 | 1,163·20 | 217·35 | 0·44 |
| 1962 .. | 2,043 | 1,448 | 981 | 1,530 | 1,101·60 | 203·70 | 0·51 |
| 1963 .. | 1,621 | 862 | 967 | 1,208 | 1,220·80 | 227·75 | 0·55 |
| 1964 .. | 2,351 | 1,162 | 1,080 | 1,618 | 1,308·40 | 237·20 | 0·53 |
| 1965 .. | 1,738 | 819 | 1,041 | 1,270 | 1,661·80 | 296·30 | 0·71 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තාවලිනි.

* පාරම 1 = හො: 5.

සංඛ්‍යා සටහන II (එ) 6 ආනයන - ප්‍රධාන භාණ්ඩ ගණ සහ භාණ්ඩ හෝ භාණ්ඩ වර්ග වශයෙන් 1959-1965

| | වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | | | | මුළු ආනයන වලින් සියයට ගණන | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| **1. පාරිභෝගික භාණ්ඩ** | **1,203** | **1,195** | **972** | **906** | **781** | **1,263** | **779** | **60·0** | **61·0** | **57·1** | **54·6** | **52·4** | **63·9** | **52·8** |
| (අ) ආහාර පාන | 800 | 752 | 672 | 630 | 629 | 1,008 | 604 | 39·9 | 38·4 | 39·5 | 38·0 | 42·2 | 51·0 | 41·0 |
| i සහල් | 283 | 242 | 217 | 195 | 192 | 326 | 144 | 14·1 | 12.3 | 12·7 | 11·7 | 12·9 | 16·5 | 9·8 |
| ii. පිටි | 106 | 65 | 69 | 71 | 60 | 137 | 98 | 5·3 | 3·3 | 4·1 | 4·3 | 4·0 | 6·9 | 6·6 |
| iii. (අ) සීනි-සුදු | 59 | 65 | 77 | 56 | 70 | 185 | 71 | 2·9 | 3·3 | 4·5 | 3·4 | 4·7 | 9·4 | 4·8 |
| (ආ) සීනි, අනෙකුත් (සක්කරා හකුරු හා සූකිරි) | 16 | 14 | 1 | 2 | 3 | 2 | 1 | 0·8 | 0·7 | 0·1 | 0·1 | 0·2 | 0·1 | 0·1 |
| iv. කිරි සහ කිරි නිෂ්පාදිත | 78 | 72 | 66 | 76 | 77 | 94 | 77 | 3·9 | 3·7 | 3·9 | 4·6 | 5·2 | 4·8 | 5·2 |
| v. මස්, මාළු සහ බිත්තර | 99 | 115 | 77 | 62 | 65 | 74 | 61 | 4·9 | 5·9 | 4·5 | 3·7 | 4·4 | 3·7 | 4·1 |
| (අ) කරවල, (උම්බලකඩ හැර එහෙත් වියලි ඉස්සන් ඇතුළුව) | 69 | 85 | 46 | 26 | 49 | 52 | 43 | 3·4 | 4·3 | 2·7 | 1·6 | 3·3 | 2·6 | 2·9 |
| (ආ) අනෙකුත් මාළු | 20 | 20 | 23 | 30 | 12 | 17 | 13 | 1·0 | 1·0 | 1·4 | 1·8 | 0·8 | 0·9 | 0·9 |
| (ඇ) මස් සහ පිළියෙල කළ මස් | 5 | 6 | 5 | 5 | 4 | 5 | 5 | 0·2 | 0·3 | 0·3 | 0·3 | 0·3 | 0·3 | 0·3 |
| (ඈ) බිත්තර | 5 | 4 | 3 | 1 | ... | – | ... | 0·2 | 0·2 | 0·2 | 0·1 | ... | – | ... |
| vi. අනෙකුත් ආහාර | 112 | 132 | 133 | 139 | 139 | 164 | 124 | 5·6 | 6·7 | 7·8 | 8·4 | 9·3 | 8·3 | 8·4 |
| (අ) අර්තාපල් | 18 | 19 | 20 | 22 | 26 | 25 | 18 | 0·9 | 1·0 | 1·2 | 1·3 | 1·7 | 1·3 | 1·2 |
| (ආ) කඩල සහ කුළුබඩු | 37 | 42 | 42 | 45 | 39 | 51 | 39 | 1·8 | 2·1 | 2·5 | 2·7 | 2·6 | 2·6 | 2·6 |
| (ඇ) ලූණු | 18 | 19 | 21 | 20 | 22 | 26 | 21 | 0·9 | 1·0 | 1·2 | 1·2 | 1·5 | 1·3 | 1·4 |
| (ඈ) මිරිස් | 25 | 37 | 33 | 36 | 38 | 46 | 30 | 1·2 | 1·9 | 1·9 | 2·2 | 2·6 | 2·3 | 2·0 |
| vii. බීම සහ සකස් කළ දුම්කොළ | 15 | 14 | 10 | 5 | 5 | 3 | 2 | 0·7 | 0·7 | 0·6 | 0·3 | 0·3 | 0·2 | 0·1 |
| (ආ) රෙදිපිළි (පිළියෙල කළ ඇඳුම් ඇතුලුව) | 179 | 196 | 172 | 149 | 83 | 165 | 107 | 8·9 | 10·0 | 10·1 | 9·0 | 5·6 | 8·4 | 7·3 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 224 | 247 | 128 | 127 | 69 | 90 | 68 | 11·2 | 12·6 | 7·5 | 7·7 | 4·6 | 4·6 | 4·6 |
| i. මෝටර් රථ | 50 | 53 | 8 | 2 | 2 | 3 | 3 | 2·5 | 2·7 | 0·5 | 0·1 | 0·1 | 0·2 | 0·2 |
| ii. ඔරලෝසු | 19 | 31 | 3 | 2 | ... | ... | ... | 0·9 | 1·6 | 0·2 | 0·1 | ... | ... | ... |
| iii. ගුවන් විදුලි යන්ත්‍ර | 10 | 12 | 3 | 1 | ... | ... | 1 | 0·5 | 0·6 | 0·2 | 0·1 | ... | ... | 0·1 |
| iv. රබර් ටයර් සහ ටියුබ් | 9 | 9 | 7 | 8 | 5 | 4 | 7 | 0·4 | 0·5 | 0·4 | 0·5 | 0·3 | 0·2 | 0·5 |
| v. ඖෂධ සහ ඖෂධීය සංයෝග | 32 | 32 | 27 | 25 | 20 | 26 | 21 | 1·6 | 1·6 | 1·6 | 1·5 | 1·3 | 1·3 | 1·4 |
| **2. අන්තර් භාණ්ඩ** | **396** | **397** | **383** | **409** | **372** | **397** | **414** | **19·8** | **20·3** | **22·5** | **24·6** | **25·0** | **20·1** | **28·1** |
| i. පොහොර වර්ග | 61 | 58 | 57 | 60 | 68 | 78 | 88 | 3·0 | 3·0 | 3·3 | 3·6 | 4·6 | 3·9 | 6·0 |
| ii. ඛනිජ තෙල් නිෂ්පාදිත | 135 | 124 | 127 | 126 | 119 | 93 | 109 | 6·7 | 6·3 | 7·5 | 7·6 | 8·0 | 4·7 | 7·4 |
| iii. ගල් අඟුරු | 11 | 17 | 9 | 9 | 9 | 12 | 10 | 0·5 | 0·9 | 0·5 | 0·5 | 0·6 | 0·6 | 0·7 |
| iv. රසායනික ද්‍රව්‍ය සහ සංයෝග | 26 | 28 | 27 | 33 | 32 | 37 | 30 | 1·3 | 1·4 | 1·6 | 2·0 | 2·1 | 1·9 | 2·0 |
| v. ඩයි වර්ග | 13 | 12 | 11 | 15 | 10 | 12 | 9 | 0·6 | 0·6 | 0·6 | 0·9 | 0·7 | 0·6 | 0·6 |
| vi. තේ හා අනෙකුත් ලී පෙට්ටි | 13 | 13 | 14 | 16 | 15 | 15 | 12 | 0·6 | 0·7 | 0·8 | 1·0 | 1·0 | 0·8 | 0·8 |
| vii. කඩදාසි හා කඩදාසි බෝඩ් | 31 | 35 | 32 | 32 | 27 | 35 | 28 | 1·5 | 1·8 | 1·9 | 1·9 | 1·8 | 1·8 | 1·9 |
| viii. කැටි නූල් හා නූල් | 21 | 25 | 23 | 22 | 13 | 22 | 41 | 1·0 | 1·3 | 1·4 | 1·3 | 0·9 | 1·1 | 2·8 |
| ix. සකස් නොකළ දුම්කොළ | 11 | 11 | 12 | 10 | 9 | 7 | 9 | 0·5 | 0·6 | 0·7 | 0·6 | 0·6 | 0·4 | 0·6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **389** | **355** | **339** | **337** | **324** | **305** | **261** | **19·4** | **18·1** | **19·9** | **20·3** | **21·7** | **15·4** | **17·7** |
| i. ගොඩනැගිලි උපකරණ | 88 | 100 | 89 | 100 | 77 | 93 | 54 | 4·4 | 5·1 | 5·2 | 6·0 | 5·2 | 4·7 | 3·3 |
| (අ) සිමෙන්ති | 22 | 18 | 22 | 20 | 18 | 15 | 17 | 1·1 | 0·9 | 1·3 | 1·2 | 1·2 | 0·8 | 1·2 |
| ii. ගමනාගමන උපකරණ | 146 | 118 | 100 | 92 | 100 | 58 | 96 | 7·3 | 6·0 | 5·9 | 5·5 | 6·7 | 2·9 | 6·5 |
| iii. යන්ත්‍රෝපකරණ | 134 | 119 | 138 | 133 | 138 | 145 | 100 | 6·7 | 6·1 | 8·1 | 8·0 | 9·3 | 7·3 | 6·8 |
| **4. ඉහත ශීර්ෂවල (1, 2 හා 3) එකතුව** | **1,988** | **1,947** | **1,694** | **1,652** | **1,477** | **1,965** | **1,454** | **99·2** | **99·3** | **99·5** | **99·5** | **99·1** | **99·5** | **98·6** |
| **5. වර්ග නොකළ ආනයන** | **17** | **13** | **9** | **8** | **13** | **10** | **20** | **0·8** | **0·7** | **0·5** | **0·5** | **0·9** | **0·5** | **1·4** |
| **6. මුළු ආනයන** | **2,005** | **1,960** | **1,703** | **1,660** | **1,490** | **1,975** | **1,474*** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තා වලිනි

* 1965 තුළදී ලද නියම ආනයන මිල දර්ශකයන් වශයෙන් මෙම සංඛ්‍යාවෙහි ඇති නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මෙම කොටසෙහි හැඳින්වීම කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ

1964 දී ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි මුළු අපනයන පරිමාව ඉකුත් වසරට වඩා සියයට 34 කින් ප්‍රාසාරණය වූ බවෙක් දක් විය. කෙසේවුව, අයහපත් කාලගුණය හේතු කොට ගෙන, 1965 තුළ දී පොල් නිෂ්පාදන තියුණු ලෙස පහළ වැටුනෙන් පොල් නිෂ්පාදිතයන්ගේ අපනයනය වේගයෙන් අඩුවිය. මුළු පොල් නිෂ්පාදිතයන්ගේ පරිමාව පසුගිය වසරට වඩා සියයට 22 කින් පහළ වැටිනි. පොල්තෙල් හා කොප්පරා වල අපනයන පරිමාව පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 30 කින් පහළ වැටුන අතර, කපාපු පොල් අපනයන පරිමාව ඊට වඩා අඩු වේගයකින්, එනම්, සියයට 4 කින් පහළ වැටුනි.

1964 තුළ දී පිළිවෙලින් සියයට 7 කින් හා සියයට 4 කින් වැඩි වූ පොල්තෙල් හා කොප්පරා වල සාමාන්‍ය නැ. වි. ස. මිල, 1965 වසර තුළ දී තවදුරටත් ඉහළ නැගුනේ, එම ඉහළ නැඟීම පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 25 ක් විය. මෙය 1960 ට පසුව මෙකී නිෂ්පාදනයන් ලැබූ ඉහළම මිල මට්ටම විය. 1964 තුළ දී සියයට 4 කින් පහළ වැටුන කපාපු පොල්වල සාමාන්‍ය නැ. වි. ස මිල 1965 තුළ දී සියයට 34 කින් තියුණුව වැඩි වූයේ, එම මිලෙහි උසස් පුනරුත්ථානයක් දක්විය. මෙම නිෂ්පාදිතයන් සඳහා කොළඹ වෙළෙඳ පොලෙහි වූ මිල හැඩගැස්ම මෙම මිල සංචලනයෙන් පිළිබිඹු විය. වර්ෂය ආරම්භයේ දී මෙකී වෙළෙඳ පොලෙහි පොල්තෙල් මිල ස්ථිරව පැවතුනේ, මුල් කාර්තුව අවසානයේ දී ඉතා උසස් මට්ටමක් දක්වා මිල නොකඩවා ඉහළ නැගුනි. ඉක්පසුව මිල ඉහළ යාමේ වේගය තරමක් අඩු වී ගිය මුත් වසරේ මුල් අඩ තුළ මිල තත්ත්වය, ඉකුත් වර්ෂයේ එම කාර්තුවලදී පැවැති මිල තත්ත්වයට වඩා උසස් මට්ටමක පැවතුනි. වර්ෂයේ සැප්තැම්බර් මාසය තුළ දී මිලෙහි පහළ වැටීමෙක් ඇති විය. එම මාස තුළ ටොන් එකක සාමාන්‍ය මිල රු. 1,069 ක් වූයේ 1964 දී සාමාන්‍ය හොණ්ඩරයක් සඳහා වූ මිලට වඩා අඩු වූයේ රු. 19 කින් පමණි. ඉන් පසුව මිලෙහි හැඩගැස්ම දියුණු වූයේ වර්ෂය අවසාන වන විට, මෙම වර්ෂයේ මුල් භාගයේ දී නැග තුබූ උස් මට්ටම් වලට නැවතත් පැමිණිය හැකි බවට පෙරනිමිති පහළ විය. මෙම වර්ෂයේ දී හොණ්ඩරයක මිල සාමාන්‍ය රු. 1,268 ක් වූයේ, ඉකුත් වසරට වඩා ටොන් එකක රු. 180 ක හෙවත් සියයට 17 ක වැඩිවීමෙක් දක්විනි. පොදු වශයෙන් කොප්පරා වල මිල ද, පොල් තෙල් මිල අනුමතය කලෙන් වතු කොප්පරා නො. 1, පාරමක සාමාන්‍ය මිල රු. 204 ක් වූයේ පසුගිය වසරට වඩා පාරමක මිල රු. 36 කින් හෙවත් සියයට 21 කින් වැඩි විය. පොල්තෙල් වල හා කොප්පරා වල පොදු මිල හැඩගැස්ම අනුව කපාපු පොල් මිල ද, වර්ෂයේ වැඩි කාලයක් තුළ දී වේගයෙන් ඉහළ නැගුනි. වර්ෂය තුළ දී කපාපු පොල් රාත්තලක සාමාන්‍ය මිල සත 52 ක් වූයේ, 1964 දීට වඩා රාත්තලකට සත 12 ක හෙවත් සියයට 30 ක වැඩිවීමෙක් දක්විනි.

1965, ආහාරයට ගන්නා තෙල් වර්ග වලට ජාත්‍යන්තර වෙළෙඳ පොල වලදී සෞභාග්‍යය උදාකර දුන් වසරකි. මෙකී තෙල් වර්ග අතර, පොල්තෙල් ඇතුළු එම ගණයේ අනෙකුත් තෙල් වර්ග ද විය. පාරිභෝගිකයන් විසින් වර්ෂය ආරම්භයේ දී තොග අඩුවෙන් තබා ගැනීම හේතුකොට ගෙන ඉල්ලුම වැඩිවීම නිසාත්, සුළිසුළං හේතුකොට ගෙන පොල් වගාවට හානි ඇති වීමෙන් පිලිපීනයේ කොප්පරා නිෂ්පාදනය සියයට 20 කින් අඩුවනු ඇතැයි වර්ෂයේ එම කාලසීමාව තුළ දී අපේක්ෂාවක් වූ නිසාත්, වර්ෂයේ මුල් මාස වලදී පොල්තෙල් මිල දැඩි ලෙසින් ඉහළ නැගිනි. තරමක් දුරට, වියට්නාමයේ කලබලකාරී තත්ත්වය උග්‍රවීමේ හේතුවෙන් පිලිපීනය කොප්පරා සැපයීම සම්පූර්ණයෙන් ඇන හිටවන විට කොප්පරා සැපයුම් තත්ත්වයෙහි හිඟයක් ඇතිවන බව අප්‍රේල් වලදී පැහැදිලි විය. එහෙත්. වර්ෂය මඳක් ගෙවී යන විට, කොප්පරා පහසුවෙන් ලබා ගැනීමට

හැකිවීමත්, ඇ. එ. ජ. යෙන් හොඳ සෝයා බෝංචි පලදාවක් බලාපොරොත්තු වීමත් හේතුකොට ගෙන මිල පහසු අතට හැරිණි. වර්ෂය අවසාන යේදී පොල්තෙල් මිල නැගී එන බවක් පෙනිණි.

**ආනයන.**

රේගු වාර්තා වලින් පිළිබිඹු වන පරිදි ආනයන, ප්‍රධාන වර්ග අනුව සහ භාණ්ඩ ගණ අනුව වර්ග කොට II (එ) 6 සංඛ්‍යා සටහනෙහි ද දක්වා ඇත.

මේ කොටසෙහි හැඳින්වීමේ දී අවධාරනයෙන්ම දක්වා ඇති අයුරු, රේගු වාර්තා වල දක්වා ඇති 1965 තුළ දී කැරුන මුළු ආනයන වල වටිනාකම වූ රුපියල් කෝටි 147·4, වසර තුළ දී ඇත්ත වශයෙන්ම ලැබුන ආනයන ඉතා අඩුවෙන් සඳහන් කිරීමකි. 1964 දීට වඩා රුපියල් කෝටි 50·1 තියුණු සංකෝචනයක් ඇති වූ බැව් ඉහත කී සංඛ්‍යාව අනුව හැඟී යන හෙයින් එම සංඛ්‍යාවන් පිළිබඳ ව අර්ථ නිරූපනය කළ යුත්තේ ඉතා පරීක්‍ෂාකාරීවය. රේගු වාර්තා උඩ සැකැසුන, 1965 සඳහා වූ ආනයන දක්වෙන II (එ) 6 සංඛ්‍යා සටහනෙහි සංඛ්‍යාවන් අගැයීමේදී යට කී කරුණු සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය.

පසුගිය වසරේ වාර්තාවෙහි දක්වා ඇති පරිදි, එක් වසරක් තුළ ආහාර කොමිසාරිස් වරයාට ලැබුන සහල්, තිරිඟු පිටි හා සීනි ආනයන අතර ද, එම වර්ෂය තුළ දී ආනයන කළ බවට රේගුවේ සංඛ්‍යා වල වාර්තා ගත වූ වටිනාකම් අතර ද, ප්‍රමාණවත් වෙනසක් ඇත. 1964 හා 1965 සඳහා මෙම වෙනස පහත සඳහන් සංඛ්‍යා වලින් දැක්වෙයි:—

ප්‍රමාණය . . (ප්‍ර) = ටොන් දහසින්
වටිනාකම . . (ව) = රුපියල් දශලක්ෂ
සාමාන්‍ය ඒකක මි, මිල.ගැ. (මි) = රු. / ටොන් එකකට

| | | ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යා | | | | රේගු සංඛ්‍යා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1964 | 1965 | වෙනස නියම | වෙනස % | 1964 | 1965 | වෙනස නියම | වෙනස % |
| සහල් | — ප්‍ර | 547 | 642 | + 95 | +17·4 | 648 | 276 | —372 | — 57·4 |
| | — ව | 283 | 342 | + 95 | +20·8 | 326 | 144 | —182 | — 55·8 |
| | — මි | 517·48 | 532·56 | + 15·08 | + 2·9 | 503·91 | 523·81 | + 19·90 | + 3·9 |
| තිරිඟුපිටි | — ප්‍ර | 225 | 310 | + 85 | +37·8 | 308 | 211 | — 97 | — 31·5 |
| | — ව | 100 | 135 | + 35 | +35·0 | 137 | 98 | — 39 | — 28·5 |
| | — මි | 442·61 | 435·54 | — 7·07 | — 1·6 | 445·82 | 464·51 | + 18·69 | + 4·2 |
| සීනි | — ප්‍ර | 208 | 218 | + 10 | + 4·8 | 220 | 158 | — 62 | — 28·2 |
| | — ව | 174 | 84 | — 90 | —51·7 | 185 | 71 | —114 | — 61·6 |
| | — මි | 836·21 | 385·85 | —450·36 | —53·9 | 842·13 | 450·33 | —391·80 | — 46·5 |
| සහල්, තිරිඟු පිටි හා සීනිවල මුළු වටිනාකම | .. | 557 | 561 | + 4 | + 0·7 | 648 | 313 | —335 | — 51·7 |

සංඛ්‍යා : ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවෙන් හා ලංකා රේගු වාර්තා වලිනි.

මෙයින් පෙනී යන්නේ, රේගු වාර්තාවන් හි සංඛ්‍යා, ආහාර කොමසාරිස් වරයා විසින් 1964 දී මෙම ද්‍රව්‍ය තුන් වර්ගය ආනයන කළ ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 9·1 කින් අධි තක්සේරුවක් දක්වන අතර, 1965 දී එම ආනයනයන් රුපියල් කෝටි 24·8 කින් අඩු තක්සේරුවක් කොට ඇති බවයි. 1965 තුළ දී, ආහාර කොමසාරිස්වරයාගේ සහල්, තිරිඟු පිටි හා සීනි ආනයන

යන්ගේ මුළු වටිනාකම රුපියල් කෝටි 56·1 ක් වූයේ රුපියල් කෝටි 0·4 කින් හෙවත් සියයට 1 කින් 1964 දීට වඩා වැඩිවූ අතර, රේගු සංඛ්‍යා අනුව මෙකී ආනයනයන් රුපියල් කෝටි 33·5 කින් හෙවත් සියයට 52 කික් තියුණු ලෙස පහළ වැටුන බවෙක් පෙන්වා දෙයි ආහාර කොමසාරිස්වරයාගේ සහල් ආනයනයන්ගේ වටිනාකම රුපියල් කෝටි 3·42 ක් වූයේ ඉකුත් වසරට වඩා රුපියල් කෝටි 5·9 කින් හෙවත් සියයට 21 කින් වැඩි විය. මෙකී සංඛ්‍යා රේගු වාර්තාවන්ට ප්‍රතිවිරුද්ධ වූ අතර, එම වාර්තා අනුව, මෙකී ආනයනයන් රුපියල් කෝටි 14·4 ක් වූයේ රුපියල් 18·2 ක හෙවත් සියයට 56 ක තියුණු පහළ වැටීමෙක් දක්විය. තිරිඟු පිටි හා සීනි ආනයන සම්බන්ධයෙන් ද මෙබඳු වෙනසෙක් ඇති වී තිබෙන බැව් පෙනී යයි. ආහාර කොමසාරිස් වරයාගේ තිරිඟු පිටි ආනයන රුපියල් කෝටි 13·5 ක් වූයේ එය රුපියල් කෝටි 3·5 කින් හෙවත් පසුගිය වසරේදීට වඩා සියයට 35 කින් වැඩි විය. රේගු වාර්තා අනුව මෙකී ආනයන රුපියල් කෝටි 9·8 දක්වා බොහෝ දුරට පහළ වැටී ඇති බවත්, එය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·9 ක හෙවත් සියයට 29 ක පහළ වැටීමෙක් බවත් දක්ව·ලයි. ආහාර කොමසාරිස් වරයාගේ සීනි ආනයන රුපියල් කෝටි 8·4 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 9·0 කින් හෙවත් සියයට 52 කින් පහළ වැටිනි. එහෙත්, රේගු සංඛ්‍යා අනුව එකී ආනයනයන් රුපියල් කෝටි 7·1 දක්වා අඩු වූ බවත්, එය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 11·4 ක හෙවත් සියයට 62 ක පහත වැටීමක් බවත් පෙන්වා දෙයි. ඇත්ත වශයෙන් ආනයනය කළ භාණ්ඩ අතර ද, රේගු වාර්තාවේ වාර්තා කැරුන සංඛ්‍යා අතර ද, පවත්නා මෙකී වෙනස එකී ආනයනය කළ භාණ්ඩ ප්‍රමාණයන් කෙරෙහි ද, ඒවායේ මිල ගණන් කෙරෙහි ද පිළිබිඹු වෙයි. 1965 තුළ දී ආහාර කොමසාරිස් වරයාගේ සහල්, තිරිඟු පිටි හා සීනි ආනයන පරිමාවන්, පිළිවෙළින් සියයට 17 කින්, සියයට 38 කින් හා සියයට 5 කින් වැඩි වූ අතර, රේගු වාර්තා වලින් දක්වූයේ ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. එනම්, එකී ආනයනයන්ගේ පරිමාව පිළිවෙළින් සියයට 57 කින් සියයට 32 කින් හා සියයට 28 කින් පහළ වැටීමෙනි. ආහාර කොමසාරිස් වරයාගේ සහල් සඳහා වූ සාමාන්‍ය මි. ගැ. මිල සියයට 3 කින් වැඩි වූ අතර, තිරිඟු පිටි මිල සියයට 2 කින් අඩු විණ. එහෙත් රේගු සංඛ්‍යාවලට අනුව පෙනී යන්නේ මෙකී එක් එක් ද්‍රව්‍යයෙහි සාමාන්‍ය මි. ගැ. මිල, සියයට 4 කින් වැඩි වූ බවෙකි. ආහාර කොමසාරිස් වරයාගේ සීනි ආනයන මිල සාමාන්‍ය මි. ගැ. මිල සියයට 54 කින් පහළ වැටිණි. එහෙත් රේගුවේ වාර්තාගත සංඛ්‍යාවලට අනුව, මෙම පහළ වැටීම සියයට 47 ක් වී යැයි දක්වා ඇත.

1965 තුළදී ආහාර කොමසාරිස් විසින් නියම වශයෙන් ආනයන කැරුන භාණ්ඩ රේගු සංඛ්‍යා වලින් අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති බවත්, එසේ අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය එනම්, රුපියල් කෝටි 24·8 රේගු සංඛ්‍යා වලින් දක්වෙන රුපියල් කෝටි 50·1 ක් වූ මුළු ආනයන සංඛ්‍යාවෙහි නිරීක්ෂිත අඩුවෙහි, විශාල සමානුපාතයක් වූ බවත් ඉහත සඳහන් විශ්ලේෂණ යෙන් පැහැදිලි වෙයි.

අනෙකුත් ආනයනයන් සම්බන්ධව සලකන කල, කරවල ආනයනය භාර එකම ආයතනය වන සමුපකාර තොග වෙළෙඳ ආයතනය විසින් ආනයනය කැරුනු කරවල (හාල් මැස්සන් හා ඉස්සන් ඇතුළුව) රුපියල් කෝටි 4·7 ක වටිනාකමක් දක් වූයේ පසුගිය වසරේදීට වඩා රුපියල් කෝටි 0·9 කින් හෙවත් සියයට 16 කින් පහළ වැටීමෙක් දක්විය. ආනයනය කළ ප්‍රමාණය හොණ්ඩර 6,59,690 ක් වූයේ, හොණ්ඩර 1,23,539 ක නොහොත් සියයට 16 ක පහළ

වැටීමෙක් දක්වුන අතර, හොණ්ඩරයක සාමාන්‍ය මි. ර. ගෑ. මිල රුපියල් 71. 83 ක් වූයේ, හොණ්ඩරයකට සත 33 ක හෙවත් සියයට 1 ක සුළු වැඩිවීමෙක් පිළිබිඹු කැරිණි. සමූපකාර තොග වෙළෙඳ ආයතනය විසින් නියම වශයෙන් ආනයනය කළ රෙදිපිළි යාර කෝටි 8·5 ක් වූයේ එම ආනයනයන්ගේ මි. ර. ගෑ. වටිනාකම රුපියල් කෝටි 7·2 ක් විය. මෙකී ආනයනයන්ගේ යාරයක සාමාන්‍ය මි. ර. ගෑ. මිල සත 84 ක් විය.

1965 තුළ දී, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නියම වශයෙන් ආනයනය කැරුන පැට්‍රෝල්, භූමිතෙල්, ඩීසල් තෙල් හා උදුන් තෙල් මුළු වශයෙන් රුපියල් කෝටි 7·1 ක් වූයේ ඉකුත් වසරට වඩ රුපියල් කෝටි 0·6 ක හෙවත් සියයට 8 ක පහළ වැටීමෙක් දක්විය. මෙම ආනයනයන්ගේ මුළු ප්‍රමාණය ගැලුම් කෝටි 19·2 ක් වූයේ සියයට 11 කින් පහළ වැටුන අතර, ඒවායේ මි ර. ගෑ. මිල සාමාන්‍යය ගැලුමකට සත 39 ක් වූයේ 1964 වසරේදීට වඩා ගැලුමක් සතයකින් හෙවත් සියයට 3 කින් වැඩි විය. සංස්ථාවේ ලිහිස්සි තෙල් ආනයනය රුපියල් කෝටි 1 ක් වූයේ රුපියල් කෝටි 0·2 ක හෙවත් සියයට 17 ක අඩුවීමෙක් දක්වුන අතර, ඒවායේ පරිමාව ගැලුම් කෝටි 0·27 ක් වූයේ පසුගිය වසරට වඩා සුළු වෙනසෙක් දක්නට ලැබිනි. මෙම ආනයන යන්ගේ ගැලුමක මි. ර. ගෑ. මිල රුපියල් 3. 64 ක් වූයේ ගැලුමක් සත 75 කින් හෙවත් සියයට 17 කින් අඩු විය.

**වෙළෙඳාම පැවැති ආකාරය** (1)

II වැනි පරිශිෂ්ටයෙහි 36 වන සංඛ්‍යා සටහන, ප්‍රධාන මුදල් කලාප හා ප්‍රදේශ අනුව වෙළෙඳාම පැවැති ආකාරය පෙන්නුම් කරයි.

1965 තුළ දී, පොදු රාජ්‍ය මණ්ඩලයෙන් බැහැර රට වලට, ඩොලර් කලාපයට, යුරෝපීය ආර්ථික ප්‍රජාවට හා ආසියාතික සහ ඈත පෙරදිග ආර්ථික සමාජ ප්‍රදේශයට යැවුන ලංකා අපනයන විවිධ ප්‍රමාණයන්ගෙන් වැඩි වී ඇති බැව් වාර්තා ගත වී ඇති අතර, රන් පවුම් කලාපයට, පොදු රාජ්‍ය මණ්ඩලයට සහ යුරෝපීය නිදහස් වෙළෙඳ සංගම් ප්‍රදේශයට යැවුන ආනයන වල පහළ වැටීමෙක් දක්විනි.

වර්ෂය තුළ දී රන් පවුම් කලාපයට යැවුන අපනයන රුපියල් කෝටි 100·2 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 1·7 කින් හෙවත් සියයට 2 කින් පහළ වැටිනි. මේ කලාපයට ලංකාවෙන් යැවෙන මුළු අපනයන කොටස සියයට 51 ක් වූයේ සියයට 3 ක පහළ වැටීමෙක් දක්විය. එම කලාපයෙන් එවුන, ආනයනයන් ද රුපියල් කෝටි 68 5 ක් වූයේ, ඉතා තියුණු ලෙසින් එනම්, රුපියල් කෝටි 25·6 කින් හෙවත් සියයට 27 කින් පහළ වැටිණි. එම කලාපයෙන් ලංකාව වෙත කැරුන මුළු ආනයනයන්ගේ කොටස සියයට 47 ක් වූයේ සියයට එකක සුළු පහළ වැටීමෙක් දක්විය. මෙම කලාපය සමග වෙළෙඳාමෙන් ඇති වූ වෙළෙඳ අතිරික්තය රුපියල් කෝටි 23·8 කින් තියුණු ලෙස වැඩි වූයේ රුපියල් කෝටි 31·7 ක් විය. ඩොලර් කලාපයට යැවුන අපනයන රුපියල් කෝටි 22 7 ක් වූයේ රුපියල් කෝටි 0·7 කින් හෙවත් සියයට 3 කින් වැඩි වූ අතර, එකී කලාපයෙන් කැරුන ආනයන රුපියල් කෝටි 6·4 ක් වූයේ රුපියල් කෝටි 1·3 ක හෙවත් සියයට 17 ක පහළ වැටීමෙක් දක්විය. මෙම කලාපයේ මුළු අපනයනවල හා ආනයනවල කොටස පිළිවෙළින් සියයට 12 ක් හා සියයට 4 ක් වූයෙන් පෙර වසර වලට වඩා වෙනසෙක් නොදක්විණි. මෙම කලාපය සමග වෙළෙඳාමෙන් ඇතිවූ වෙළෙඳ අතිරික්තය රුපියල් කෝටි 16·2 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 1·8 ක දියුණුවක් ලැබීය.

පොදු රාජ්‍ය මණ්ඩලයට යැවුන අපනයන රුපියල් කෝටි 83·8 ක් වූයේ රුපියල් කෝටි 11 කින් හෙවත් සියයට 12 කින් පහළ වැටුන අතර, මෙම ප්‍රදේශ යෙන් කැරුන ආනයනයන් වඩාත් වේගයෙන් එනම්, රුපියල් කෝටි 14·8 කින් හෙවත් සියයට 20 කින් පහළ වැටුනේ මෙම වසරේ දී රුපියල් කෝටි 59·8 ක් විය.

(1) මෙම විස්තරය රේගු සංඛ්‍යා තොරතුරු අනුව සකස් කර ඇත.

මුළු අපනයනයන්හි පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් කොටස සියයට 43 ක් වූයේ සියයට 4 කින් පහළ වැටීමෙක් දක් වූ අතර, මුළු ආනයනයන්හි ලා එයට අයත් කොටස සියයට 41 ක් වූයේ සියයට 3 කින් වැඩි විය. පොදු රාජ්‍ය මණ්ඩලයට යැවුන අපනයන වලත්, ලංකාවේ මුළු අපනයනයන්හි ලා එකී අපනයනයන්ට අයත් කොටසෙහිත්, තරමක් තියුණු පහළ වැටීමක් ඇති වීමට බොහෝ දුරට හේතු වූයේ තව දුරටත්, පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන දකුණු අප්‍රිකා එක්සත් රාජ්‍යය සමග පැවැති වෙළෙඳාම පොදු රාජ්‍ය මණ්ඩලයෙන් බැහැර රටවල් සමග පැවැති ලංකා වෙළෙඳාමෙහි කොටසක් ලෙසින්. සැලකීමය. 1965 තුළ දී, පොදු රාජ්‍ය මණ්ඩලය සමග වෙළෙඳාමෙන් අයත් වූ අතිරික්තය රුපියල් කෝටි 23·9 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·7 ක වැඩිවීමෙකි.

යුරෝපීය ආර්ථික ප්‍රජාව වෙත යැවුන අපනයන රුපියල් කෝටි 18·4 ක් වූයේ රුපියල් කෝටි 1·6 කින් හෙවත් සියයට 10 කින් වැඩි වූ අතර, ප්‍රජාවෙන් එවුන ආනයන රුපියල් කෝටි 19·4 ක් වූයේ රුපියල් කෝටි 3·6 ක හෙවත් සියයට 16 ක පහළ වැටීමෙක් දක්විය. මුළු අපනයනයන්හි ලා "ප්‍රජාවට" අයත් වූ කොටස සියයට 9 ක් වූයෙන්, පසුගිය වසරට වඩා එහි වෙනසක් ඇති නොවිනි. එහෙත් මුළු ආනයනයන්හි ලා එයට අයත් කොටස සියයට 13 ක් වූයේ සියයට එකක සුළු වැඩිවීමෙක් දක්විය. රුපියල් කෝටි 1·0 ක හිඟයක් දක් වූ ප්‍රජාව, සමග පැවැති වෙළෙඳාම මෙ වසරේ දී පසුගිය වසරට වඩා රුපියල් කෝටි 5·2 ක දියුණුවක් ගෙනහැර පැවේ ය. යුරෝපීය වෙළෙඳ සංගම් ප්‍රදේශයට යැවුන, අපනයන රුපියල් කෝටි 51·8 ක් වූයේ රුපියල් කෝටි 2·9 කින් හෙවත් සියයට 5 කින් පහත වැටුන අතර, එම රට වලින් එවුනු ආනයන වඩාත් වේගයෙන් එනම්, රුපියල් කෝටි 7 කින් හෙවත් සියයට 19 කින් පහත වැටුනි. මේ රටවල් සමග පැවැති වෙළෙඳාමෙන් ඇති වූ අතිරික්තය 1964 දී රුපියල් කෝටි 18·2 ක් වූයේ, රුපියල් කෝටි 22·4 දක්වා වැඩි විය.

"ආසියාතික හා ඈත පෙරදිග ආර්ථික සමාජයට අයත් රට වලට (මෙම ප්‍රදේශයට ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා බටහිර සමෝවා දූපත් ඇතුලත් වෙයි) යැවුන අපනයන රුපියල් කෝටි 45·2 ක් වූයේ රුපියල් කෝටි 2·4 කින් හෙවත් සියයට 6 කින් වැඩි වූ අතර, මෙම ප්‍රදේශයෙන් එවුනු ආනයන රුපියල් කෝටි 65·1 වූයේ රුපියල් කෝටි 31·6 කින් හෙවත් සියයට 33 කින් පහත වැටිනි. ලංකාවේ මුළු අපනයනයන් ගෙන් සියයට 23 ක් මෙම ප්‍රදේශයට අයත් වූ අතර, එය 1964 මට්ටමෙහි ම පැවැතිණි. එහෙත් ආනයනයන්හි ලා එම ප්‍රදේශයට අයත් වූ කොටස සියයට 44 ක් වූයේ සියයට 5 කින් පහළ වැටිනි.

**චීනය සමග වෙළෙඳම**

II (එ) 7 සංඛ්‍යා සටහනින් චීන ලංකා වෙළෙඳ ගනුදෙනු පිළිබඳ විස්තර දක්වෙයි.

සංඛ්‍යා සටහන II (එ) 7

**චීනය සමග වෙළෙඳම.**

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය |
|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශ ලක්ෂ | මුළු ප්‍රාදේශීය අපනයන වලින් සියයට ගණන | වටිනාකම රු. දශ ලක්ෂ | මුළු ආනයන වලින් සියයට ගණන | රු. දශ ලක්ෂ |
| 1956 .. .. | 182 | 11·0 | 134 | 8·2 | + 48 |
| 1957 .. .. | 167 | 10·5 | 84 | 4·6 | + 83 |
| 1958 .. .. | 78 | 4·7 | 152 | 8·8 | — 74 |
| 1959 .. .. | 78 | 4·6 | 150 | 7·5 | — 72 |
| 1960 .. .. | 121 | 6·6 | 132 | 6·8 | — 12 |
| 1961 .. .. | 83 | 4·9 | 35 | 2·0 | + 48 |
| 1962 .. .. | 133 | 7·5 | 41 | 2·5 | + 92 |
| 1963 .. .. | 101 | 5·9 | 138 | 9·2 | — 37 |
| 1964 .. .. | 122 | 6·6 | 204 | 10·3 | — 82 |
| 1965 .. .. | 172 | 9·0 | 114 | 7·7 | + 58 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තා වලිනි.

රේගු සංඛ්‍යා අනුව, 1965 තුළ දී චීනය වෙත යැවුන අපනයන රුපියල් කෝටි 17·2 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 5 ක හෙවත් සියයට 41 ක ප්‍රාසාරණයක් දක්වාලීය. චීනයෙන් එවුනු ආනයන රුපියල් කෝටි 11·4 ක් වූයේ රුපියල් කෝටි 9·0 කින් හෙවත් සියයට 44 කින් පහත වැටිනි. වෙළෙඳ ශේෂයෙහි රුපියල් කෝටි 5·8 ක අතිරික්තයක් ඇති විය.

චීනයට අපනයනය කළ ප්‍රධාන භාණ්ඩය වූ රබර් වල වටිනාකම 1965 තුළ රුපියල් කෝටි 12·73 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·39 ක වැඩි වීමෙකි. 1964 තුළ දී අපනයනය කළ තේ වල වටිනාකම රුපියල් කෝටි 0·75 ක් වූ අතර, එය රුපියල් කෝටි 2·33 දක්වා රුපියල් කෝටි 1·58 කින් තියුණු ලෙස වැඩි විය. පොල් තෙල් අපනයනය රුපියල් කෝටි 2·12 දක්වා සුළු වැඩිවීමෙක් දක්විය.

සහල් ප්‍රධාන ආනයනය වශයෙන් තවදුරටත් පැවති අතර, චීනය සමග පවතින වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම අනුව වසර තුළ දී මෙට්‍රික් ටෙ.න් 2,00,000 ක සහල් ආනයනය කිරීමටත්, ලංකාවෙන් මෙට්‍රික් ටොන් 39,000 ක රබර් එරටට අපනයනය කිරීමටත්; 1965 දී ගිවිස ගන්නා ලදී අනෙකුත් ආනයන වලට රෙදිපිළි (රුපියල් කෝටි 2·53 ක) හා වියලි මිරිස් (රුපියල් කෝටි 0·49) ඇතුළත් විය.

**සෝවියට් සමාජවාදී සමුහාණ්ඩු සංගමය සහ**

**නැගෙනහිර යුරෝපය සමග වෙළෙඳම**

II (එ) 8 සංඛ්‍යා සටහන, මෙම ප්‍රදේශය සමග ලංකාව කළ වෙළෙඳම පිළිබඳ සංඛ්‍යා තොරතුරු දක්වයි.

සංඛ්‍යා සටහන II (එ) 8

**සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සහ නැගෙනහිර**

**යුරෝපය * සමග වෙළෙඳම**

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රු. දශලක්ෂ | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශලක්ෂ | මුළු දේශීය අපනයන යෙන් සියයට ගණන | වටිනාකම රු. දශලක්ෂ | මුළු ආනයන යෙන් සියයට ගණන | | වටිනාකම රු. දශලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුමෙහි සියයට ගණන |
| 1956 .. | 1·3 | 0·1 | 8·0 | 0·5 | — 6·7 | 9·3 | 0·3 |
| 1957 .. | 6·5 | 0·4 | 10·6 | 0·6 | — 4·1 | 17·1 | 0·5 |
| 1958 .. | 24·7 | 1·5 | 9·2 | 0·5 | +15·5 | 33·9 | 1·0 |
| 1959 .. | 28·4 | 1·7 | 23·8 | 1·2 | + 4·6 | 52·2 | 1·4 |
| 1960 .. | 58·1 | 3·3 | 21·8 | 1·1 | +36·3 | 79·9 | 2·1 |
| 1961 .. | 78·4 | 4·7 | 51·8 | 3·0 | +26·6 | 130·2 | 3·9 |
| 1962 .. | 87·1 | 4·9 | 90·3 | 5·4 | — 3·2 | 177·4 | 5·2 |
| 1963 .. | 86·1 | 5·1 | 117·1 | 7·8 | —31·0 | 203·2 | 6·3 |
| 1964 .. | 159·4 | 8·7 | 158·2 | 8·0 | + 1·2 | 317·6 | 8·3 |
| 1965 .. | 174·3 | 9·1 | 172·7 | 11·7 | + 1·6 | 347·0 | 10·2 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තාවිලිනි.

* බල්ගේරියාව්, චෙකොස්ලොවැකියාව්, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය) හන්ගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගෝස්ලේවියාව.

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සහ නැගෙනහිර යුරෝපය සමග පවත්නා ලංකා වෙළෙඳම මෑත වර්ෂවල දී ප්‍රාසාරණය වූ අකාරයෙන්ම 1965 තුළදීද වේගයෙන් ප්‍රාසාරණය විය. මෙම ප්‍රදේශය වෙත යැවුන අපනයන රුපියල් කෝටි 1·49 කින් හෙවත් සියයට 9 කින් වැඩිවූ අතර එම ප්‍රදේශයෙන් එවුන ආනයන රුපියල් කෝටි 1·45 කින් හෙවත් සියයට 9 කින් ප්‍රාසාරණය විය. මෙම ප්‍රදේශය සමග පැවැති වෙළෙඳමෙන් ඇතිවූ අතිරික්තය රුපියල් කෝටි 0·16 ක් වූයේ පසුගිය වසරේදීට වඩා සුළු දියුණුවක් දක්නට ලැබින. දස වසරකට ඉහත දී මෙම ප්‍රදේශය සමග පැවැති ලංකා වෙළෙඳමෙහි අගය ලංකාවේ මුළු විදේශීය වෙළෙඳමෙන් සියයට එකක්ව පැවැතුන ද, 1965 දී මෙය ලංකාවේ විදේශීය වෙළෙඳමෙන් සියයට 10 ක් විය. පසුගිය වසර වලදී මෙන් මේ වසරේදීත් මේ ප්‍රදේශයේ

ලංකාවේ ප්‍රධාන ගනුදෙනු කරුවා වූයේ සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයය. එරට වෙත යැවුන අපනයනයන්ගේ වටිනාකම රුපියල් කෝටි 9·72 ක් හෙවත් මෙම ප්‍රදේශයට යැවුන අපනයන වලින් සියයට 56 ක් විය. එහෙත්, 1964 දීට වඩා මෙකී අපනයනයන් රුපියල් කෝටි 3·8 කින් පහත වැටී ඇති බවෙක් පෙනින. රබර් අපනයන රුපියල් කෝටි 3·61 ක් වූයේ රුපියල් කෝටි 1·3 කින් (සියයට 27 කින්) පහළ වැටුන අතර, පොල් තෙල් අපනයන රුපියල් කෝටි 1·57 ක් වූයේ රුපියල් කෝටි 0·14 කින් (සියයට 8 කින්) පහත වැටිනි. තේ අපනයන රුපියල් කෝටි 3·53 ක් වූයේ රුපියල් කෝටි 0·21 කින් (සියයට 6 කින්) වැඩිවිය. පෝලන්තයට යැවුන අපනයනවල වටිනාකම රුපියල් කෝටි 2·46ක් හෙවත් ලංකාවෙන් මේ ප්‍රදේශයට යැවුන ආනයන වලින් සියයට 14 ක් වූයේ රුපියල් කෝටි 0·67 කින් (සියයට 21 කින්) පහළ වැටින. ප්‍රධාන අපනයනය වන, රබර් අපනයන රුපියල් කෝටි 0·99 කින් (සියයට 39 කින) පහළ වැටුන අතර, පොල් අපනයන රුපියල් කෝටි 0·42 ක් වූයේ රුපියල් කෝටි 0·04 කින් (සියයට 9 කින්) පහළ වැටින. 1964 තුළ දී ඉතා සුළු අපනයන ප්‍රමාණයක් වූ තේ අපනයන, රුපියල් කෝටි 0·41 දක්වා ඉහළ නැගුනි. රුමේනියාව වෙත යැවුන අපනයන රුපියල් කෝටි 1·96 කින්, තියුණුව වැඩි වූයේ රුපියල් කෝටි 2·13 ක් විය. මෙම ප්‍රසාරණයට ප්‍රධාන හේතුව වූයේ රබර් අපනයන රුපියල් කෝටි 1·52 දක්වා රුපියල් කෝටි 1·4 කින් වැඩිවීමය. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට යැවුන අපනයන, රුපියල් කෝටි 1·96 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·75 ක (සියයට 62 ක) වැඩිවීමෙකි. මේ අපනයන බොහොමයක්ම පොල්තෙල් වලට හා කොප්පරා වලට සීමා විය. පොල්තෙල් අපනයන රුපියල් කෝටි 1·2 වූයේ, රුපියල් කෝටි 0·34 කින් (සියයට 40 කින්) වැඩිවූ අතර, කපාපු පොල් අපනයන රුපියල් කෝටි 0·38 කින් (සියයට 115 කින්) වැඩිවිය. චෙකොස්ලෝවේකියාව වෙත යැවුන අපනයන රුපියල් කෝටි 0·13 කින් (සියයට 28 කින්) පහත වැටුනේ රුපියල් කෝටි 0·34 ක් විය.

1965 තුළදී ද මෙම පෙදෙසෙහි වැඩිම ප්‍රමාණයක් ආනයන සැපයුවේ සෝවියට් සමූහාණ්ඩුව විසිනි. මෙම ආනයන රුපියල් කෝටි 9·99 ක් විය. මෙය පසුගිය වසරේදීට වඩා රුපියල් කෝටි 3·11 කින් (සියයට 45 කින්) වැඩිවීමෙකි. එකී ආනයන එම ප්‍රදේශයෙන් එවුනු මුළු ආනයනයන්ගෙන් සියයට 58 ක් විය. මීට පෙර වසර වලදී ප්‍රධාන ආනයනය වශයෙන් සෝවියට් සමූහාණ්ඩුවෙන් එවුන ආනයන වලින් සියයට 58 කට හිමිකම් පෑ ඛනිජ තෙල් නිෂ්පාදිත රුපියල් කෝටි 5·82 දක්වා රුපියල් කෝටි 1·6 කින් (සියයට 38 කින්) වැඩිවිය. මෙම ප්‍රදේශයෙන් එවුන ඛනිජ තෙල් නිෂ්පාදිත සමස්තයක් වශයෙන් ගත් කළ රුපියල් කෝටි 6·63 ක් හෙවත් සියළු රට වලින් එවුන මෙකී ද්‍රව්‍ය ආනයනයන්ගෙන් සියයට 61 ක් විය. සීනි (රුපියල් කෝටි 2·16) තේ පෙට්ටි (රුපියල් කෝටි 0·6) සහ රෙදිපිළි (රුපියල් කෝටි 0·54) සෝවියට් සමූහාණ්ඩුවෙන් එවුන අනෙකුත් වැදගත් ආනයනයන්ය. පෝලන්තයෙන් එවුන ආනයන රුපියල් කෝටි 3·43 ක් හෙවත් මෙම පෙදෙසින් එවුන ආනයන වලින් සියයට 20 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 1·12 කින් (සියයට 25 කින්) අඩුවීමෙකි. ප්‍රධාන ආනයනය වූ සීනි එරටින් එවුන මුළු ආනයන යන්ගෙන් හරි අඩකටත් වඩා වැඩිවිය. චෙකොස් ලෝවේකියාවෙන් එවුන ප්‍රධාන ආනයනය ද සීනිය. එරටින් එවුන මුළු ආනයන රුපියල් කෝටි 1·05 ක් වූයේ, ඉකුත් වසරට වඩා රුපියල් කෝටි 1·01 ක (සියයට 49 ක) අඩුවෙක් දැක්විය. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවෙන් එවුන ආනයන රුපියල් කෝටි 1·38 ක් වූයේ රුපියල් කෝටි 0·46 ක (සියයට 50 ක) තියුණු වැඩිවීමෙක් දැක්විය. පොහොර ආනයන රුපියල් කෝටි 0·68 ක් වූයේ රුපියල් කෝටි 0·49 කින් වැඩිවූ අතර සිමෙන්ති ආනයන රුපියල් කෝටි 0·58 ක් වූයේ රුපියල් කෝටි 0·33 ක වැඩිවීමෙක් දැක්විය. මෙම ප්‍රදේශයෙන් එවුන සිමෙන්ති ආනයන සමස්තයක් වශයෙන් ගත් කළ, රුපියල් කෝටි 1·18 ක් හෙවත් සියළුම රටවලින් එවුන මෙම ද්‍රව්‍ය ආනයනයෙන් සියයට 70 ක් විය. 1964 දී රුපියල් කෝටි 0·9 කින් පහළ වැටුනු රුමේනියාවෙන් එවුනු ආනයන රුපියල් කෝටි·

1·27 ක් වූයේ රුපියල් කෝටි 0·44 ක වැඩිවීමෙක් දක්විය. ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන රුපියල් කෝටි 0·81 ක් වූයේ රුපියල් කෝටි 0·36 කින් වැඩිවී ඇත. ඛනිජ තෙල් ආනයන එරටින් එවුන මුළු ආනයන වලින් සියයට 64 ක් විය.

**ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්.**

මහජන චීන සමූහාණ්ඩුව, සෝවියට් සමූහාණ්ඩුව සහ නැගෙනහිර යුරෝපයේ සහ මැද පෙරදිග තවත් සමහර රටවල් කිහිපයක් සමග ලංකාව ඇති කරගත් ගෙවීම් ගිවිසුම් අනුව පවත්වා ගනු ලබන ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම් වල ඒ ඒ කාර්තු අවසානයේදී වූ ශුද්ධ සමුච්චය තත්ත්වය II (එ) 9 සංඛ්‍යා සටහනින් දක්වේ.

සංඛ්‍යා සටහන II (එ) 9

**ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම් - 1959 - 1965 නිෂ්කාශන ගිණුම්වල (ශුද්ධ) එකතුව - කාර්තු වශයෙන්**

රුපියල් දශලක්ෂ වලින්

| අවසානයට ගිණුම් නතු (ශුද්ධ) | චීනය සෝ. ස ස. සං සහ අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවල්* | | මැද පෙරදිග රටවල් ** | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | බැර | හර | බැර | හර |
| 1959 මාර්තු .. .. | 10·3 | — | — | — | 10·3 | — |
| ජුනි .. .. | — | 4·5 | — | — | — | 4·5 |
| සැප්තැම්බර් .. .. | 22·2 | — | — | — | 22·2 | — |
| දෙසැම්බර් .. .. | — | 11·7 | — | — | — | 11·7 |
| 1960 මාර්තු .. .. | — | 18·9 | — | — | — | 18·9 |
| ජුනි .. .. | — | 2·6 | — | — | — | 2·6 |
| සැප්තැම්බර් .. .. | — | 13·3 | — | — | — | 13·3 |
| දෙසැම්බර් .. .. | — | 26·5 | — | — | — | 26·5 |
| 1961 මාර්තු .. .. | — | 39·4 | — | — | — | 39·4 |
| ජුනි .. .. | — | 25·5 | — | 1·7 | — | 27·2 |
| සැප්තැම්බර් .. .. | 11 8 | — | — | 1·9 | 9·9 | — |
| දෙසැම්බර් .. .. | 10·6 | — | — | 5·4 | 5·2 | — |
| 1962 මාර්තු .. .. | — | 6·9 | — | 7·0 | — | 13·9 |
| ජුනි .. .. | — | 42·8 | — | 10·0 | — | 53·5 |
| සැප්තැම්බර් .. .. | — | 22·3 | — | 10·8 | — | 53·1 |
| දෙසැම්බර් .. .. | — | 7·3 | — | 5·4 | — | 12·7 |
| 1963 මාර්තු .. .. | — | 0·2 | — | 2·7 | — | 2·9 |
| ජුනි .. .. | 12·2 | — | 0·6 | — | 12·8 | — |
| සැප්තැම්බර් .. .. | — | 6·5 | 2·1 | — | — | 4·4 |
| දෙසැම්බර් .. .. | 31·1 | — | 3·1 | — | 34·2 | — |
| 1964 මාර්තු .. .. | 52·3 | — | — | 0·3 | 52·0 | — |
| ජුනි .. .. | 58·4 | — | 2·4 | — | 60·8 | — |
| සැප්තැම්බර් .. .. | 59·1 | — | — | 1·9 | 57·2 | — |
| දෙසැම්බර් .. .. | 57·0 | — | — | 5 5 | 51·5 | — |
| 1965 මාර්තු .. .. | 57·9 | — | — | 5·0 | 52·9 | — |
| ජුනි .. .. | 12·1 | — | — | 8·7 | 3·4 | — |
| සැප්තැම්බර් .. .. | — | 46·6 | — | 6·6 | — | 5322 |
| දෙසැම්බර් .. .. | — | 25·3 | ... | 5·8 | — | 31·1 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* බල්ගේරියාව, චෙකොස්ලොවෙකියාව, ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය), හංගේරියාව, පෝලන්තය සහ රුමේනියාව, යුගෝස්ලෝවියාව (1965 මාර්තු සිට) සහ ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු මහජන සමූහාණ්ඩුව (1965 මාර්තු සිට)

** එක්සත් අරාබි සමූහාණ්ඩුව, අයිරානය (1964 ඔක්තෝබර් දක්වා) සහ සිරියාව.

සැ. යු. බැර — ලංකාවෙන් අයවිය යුතු.
හර — ලංකාවට අයවිය යුතු.

## වාණිජ ප්‍රතිපත්ති සැකැසුන අයුරු

### ආනයන පාලනය

1964 දෙසැම්බර් 15 දින, ඖෂධ වර්ග පුද්ගලික ආනයන බලපත්‍ර විධිවිධාන යන්ට යටත් කිරීමත් සමගම විවෘත ආනයන බලපත්‍ර ක්‍රමය මුළුමනින් ම අහෝසි විය. මින්පසු, වැදගත් බව්න් ඉතා අඩු භාණ්ඩ කීපයක් හැරෙන්නට පෞද්ගලික අංශයේ අනෙකුත් සියළු ආනයන පුද්ගලික ආනයන බලපත්‍ර විධිවිධාන යටතට පත් කරනු ලැබ ඇත.

මුලින් සැකැසුන පරිදි, 1965 විදේශීය විනිමය අයවැය ලේඛනයෙන්, මූළු වශයෙන් රුපියල් කෝටි 175 ක් ආනයනය සඳහා වෙන් කිරීමට ඉඩ සැලසින. මෙකී වෙන් කිරීම් කීපයක් පසුව ප්‍රතිශෝධනය කරන ලදුව, මුළු වෙන් කිරීම රුපියල් කෝටි 195·9 දක්වා රුපියල් කෝටි 20·9 කින් වැඩි කිරීමට අවැසි විය. මෙකී ප්‍රතිශෝධනයට ප්‍රධාන හේතුව වූයේ ආහාර කොමසාරිස්ගේ ආනයනයන් වන සහල්, තිරිඟු පිටි, සීනි සහ අප්‍රධාන ආහාර ද්‍රව්‍ය සඳහා කැරුන වෙන් කිරීම් රුපියල් කෝටි 19·4 කින් වැඩිවීමය. දූඩි නියඟයේ විෂම බලපෑම හේතුකොට ගෙන දේශීය සහල් නිෂ්පාදනය පහත වැටීම නිසා සහල් විශාල ප්‍රමාණයක් ආනයන කිරීමට අවැසි වීම යටකී වෙන් කිරීමේ වැඩිවීමට හේතුවිය. වර්ෂය තුළදී එම වෙන් කිරීම් තව දුරටත් ප්‍රතිශෝධනය කිරීමට අවැසි විය. අවසාන ප්‍රතිශෝධනයෙන් පසුව එම වෙන් කිරීම රුපියල් කෝටි 197 ක් විය. පහත සඳහන් සංඛ්‍යා වලින් වෙන් කිරීම් වල මුල් තත්ත්වය හා පසුව කැරුන සංශෝධන පිළිබිඹු වෙයි.

**1965, විදේශ විනිමය අයවැය ලේඛනය.**

රුපියල් දශලක්ෂ

| | 1965 මූලික | 1965 ප්‍රතිශොධිත | 1965 අවසාන වශයෙන් ප්‍රතිශොධිත |
|---|---|---|---|
| ආහාර කොමසාරිස්තුමාගේ ආනයන .. .. | 500 | 694 | 602 |
| රජයේ දෙපාර්තමේන්තු සහ කාර්මික නොවන සංස්ථා .. | 150 | 150 | 214 |
| පැට්‍රෝල් .. .. .. .. | 130 | 115 | 115 |
| සිමෙන්ති .. .. .. .. | 25 | 25 | 18 |
| පොහොර .. .. .. .. | 80 | 80 | 91 |
| ඖෂධ .. .. .. .. | 25 | 25 | 25 |
| රෙදිපිළි .. .. .. .. | 100 | 100 | 101 |
| නිෂ්පාදන කර්මාන්ත .. .. .. | 200 | 235 | 231 |
| අවශේෂ ආහාර ද්‍රව්‍ය .. .. .. | 280 | 280 | 309 |
| සාමාන්‍ය වෙළෙඳ සලාක .. .. .. | 225 | 225 | 218 |
| පාවිච්චි කරන්නන්ගේ අවක්‍ර ආනයන .. .. | 35 | 30 | 46 |
| එකතුව .. .. .. .. | 1,750 | 1,959 | 1,970 * |

* තාවකාලිකයි — සංඛ්‍යා: ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

## තිරු බදු

### ආනයන බදු

ආනයන බදු පිළිබඳව, 1965 අගෝස්තු 9/10 දින මැදියම් රැයෙහි සිට වලංගු වියයුතු වැදගත් වෙනස් කිරීම් කිහිපයක් මුදල් ඇමතිතුමා 1965 අගෝස්තු 9 වැනි දින, එතුමාගේ අයවැය ලේඛන කථාවෙන් ප්‍රකාශයට පත් කොළේය. මෙකී වෙනස් කිරීම් වලට අනුව හා ජීවන වියදම් පහත හෙලීම සඳහා ප්‍රමාණයත් ආධාරයක් සැලසෙන ක්‍රියා මාර්ගයක් වශයෙන්, අත්‍යාවශ්‍ය පාරිභෝජන භාණ්ඩ කීපයකම්, එනම්, හුම්තෙල්, මිරිස්, අර්තාපල්, එළුනූ, පරිප්පු, කඩල හා මෑ, තිරිඟු, ඕට්ස්,

සහ බාර්ලිවල තීරු බදු සම්පූර්ණයෙන්ම අහෝසි කර දමන ලදී. කපුරෙදි වර්ග වල සහ කෘතිම රෙදි වර්ග කිහිපයක ආනයන බදු ද අඩු කරන ලදී. මෙකී ශීර්ෂ බොහොමයක්ම සම්බන්ධයෙන් බදු අඩු කිරීම, වටිනාකම අනුව බදු අය කිරීමේ තත්ත්වයෙන් නියමිත බදු අයකිරීමේ තත්ත්වයට වෙනස්වීමකි. කෘතිම රෙදි වර්ග සඳහා පැනැ වුන පැරණි බදු සම්පූර්ණයෙන්ම අහෝසිකර දමූ අතර එම ශීර්ෂයන් කෘතිම සිල්ක් රෙදි ගණයට එක්වින. මෙම ගණයේ ශීර්ෂ බොහොමයකටම අය කැරුනු බද්ද සැලකිය යුතු තරම් අඩු බද්දකි. මෙයට අතිරේකව, උදළු, අලවංගු ආදී සුළු කෘෂිකාර්මික උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ සඳහා වූ ආනයන බදු ද අහෝසි කර දමන ලදී. මෙකී ආනයන බදු වෙනස් කිරීම හේතුකොගෙන ආදායම රුපියල් කෝටි 1·8 කින් අඩුවී ඇති බැව් ඇස්තමේන්තු කර තිබේ.

1966 ජනවාරි 1 වැනි දින සිට කළුතෙල්, මෝටර් වාහන බද්ද අහෝසි කිරීමට තමන් තීරණය කර ඇති හෙයින්, එයින් ඇතිවන ආදායම් හිඟය පිරිමසාලීම් වස් සක්‍රිය ඩීසල් තෙල් සඳහා පැනවුන බද්ද වැඩි කිරීමට තමන් අදහස් කරන බවද ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මේ අනුව, 1966 ජනවාරි 26/27 දින මැදියම් රැයෙහි සිට මෙකී ශීර්ෂය සඳහා වූ ආනයන බද්ද ගැලුමක් සත 25 සිට සත 75 දක්වා වැඩි කරන ලදී. එදින සිට, ට්‍රැක්ටර් ඇතුලු විශේෂිත කාර්මික උපකරණ, නාවික ඩීසල් යන්ත්‍ර හා මසුන් මරන යාත්‍රාවලට අවශ්‍ය කොටස් හා දේශීය ධීවර කර්මාන්තය සඳහා ආනයනය කැරෙන පිටතින් සවි කරන මෝටර් සඳහා වූ ආනයන බදු අහෝසි කර දමන ලදී. කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා පමණක් ම පාවිච්චියට ගන්නා රබර් ටයර් හා ටියුබ් සඳහා වූ බද්ද සියයට 72 සිට සියයට 50 දක්වා අඩු කරන ලදී.

අයවැය කථාවේදී ප්‍රකාශයට පත්වූ තවත් වැදගත් වෙනස් කිරීමක්, වැදගත් ද්‍රව්‍ය තුනක් සඳහා එනම්, රෙදිපිළි, යකඩ, වානේ සහ කඩදාසි සඳහා බදු පැනවුන පදනමට අදාල විය. මේ වර්ගවලට අයත් ඇතැම් විශේෂිත ද්‍රව්‍ය ශීර්ෂ සඳහා වූ වටිනාකම අනුව නියම කෙරුන බද්ද, විශේෂිත බද්දක් බවට හැරවීමට තීරණය කරන ලදී. ආනයන පාලන ආධිපත්‍යය යටතේ ඉහත සඳහන් භාණ්ඩයන් ලබා ගැනීමේ හැකියාව වෙනස් වීම නිසා මෙම ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු ආනයන බදු පිළිබඳ තත්ත්වය බොහෝදුරට අස්ථාවර විය. මෙයට හේතු වූයේ වටිනාකම් අනුව බදු තක්සේරුව සඳහා භාණ්ඩ අගැයීමේදී මිණුම් දණ්ඩ වශයෙන් ගැනුන තොග වෙළෙඳ පොලේ වටිනාකම්, දේශීය වෙළෙඳ පොලේ මෙම ද්‍රව්‍ය සැපයුම් වල වෙනස් වීම් අනුවම වෙනස් වීමයි. ආනයන කරුවනට තමන් බලාපොරොත්තුවෙන් සිටින නැව් තොග සම්බන්ධයෙන් ගෙවීමට සිදුවන බද්ද පිළිබඳව අනිස්චිර තත්ත්වයකින් පසුවීමට සිදුවීම ඇතුළු අවාසි සහගත ප්‍රතිඵල වලට මෙම පදනම යටතේ වටිනාකම් අනුව බදු පැනවීම හේතු වනු ඇත. මේකී ද්‍රව්‍ය සඳහා විශේෂිත බදු පැනවීමට තීරණය කරන ලද්දේ මේ නිසාය.

ඉහත සඳහන් බදු අහෝසි කිරීම හෝ අඩු කිරීම නිසා ආදායමෙහි ඇතිවන හිඟය මකාලනු වස්, ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා සංයෝග, පොහොර, භූමිතෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදිත රෙදිපිළි, අමතර කොටස්, සිමෙන්ති, කෘෂිකාර්මික යන්ත්‍ර හා උපකරණ හා අපනයන කර්මාන්තයන් සඳහා පාවිච්චි කැරෙන ශීර්ෂයන් හැර අනෙකුත් වර්ගවල සියළුම ආනයන සඳහා පවත්නා බදු වලින් සියයට 10 ක් වන අධි මිලක් පනවන ලදී. මෙයින් රුපියල් කෝටි 2·2 ක අතිරේක ආදායමක් ලැබෙන බව ඇස්තමේන්තු කොට තිබින.

**අපනයන බදු**

1965 තුළදී අපනයන බදු සම්බන්ධයෙන් වෙනසෙක් ඇති නොවිය.

**වෙළෙඳ ගිවිසුම්**

වසර තුළදී පහත සඳහන් වෙළෙඳ විධිවිධාන ඇතිකර ගන්නා ලදී:-

**ඉන්දියාව**

1961 ඔක්තෝබර් 28 වැනි දින දරන වෙළෙඳ ගිවිසුම අනුව 1965 වද වෙළෙඳ විධිවිධාන පිළියෙල කිරීම සඳහා ජනවාරියේදී සාකච්ඡා පවත්වන ලදී. මේ අනුව, නියමිත ප්‍රමාණවලින් කොප්පරා, පොල්තෙල් හා රබර් ලංකාවෙන් අපනයනය කිරීමටත්, කරවල, සියඹලා සහ සක්කරා නියමිත ප්‍රමාණයක් ඉන්දියාවෙන් ආනයනය කිරීමටත් විධිවිධාන යොදවන ලදී.

**තායිලන්තය**

දෙරට අතර පවත්නා වෙළෙඳාම පුළුල් කර ගැනීම අරමුණු කොට තායිලන්ත රජයත් සමග වෙළෙඳ සම්මුතියක් 1965 මැයි 21 වැනි දින ඇතිකර ගන්නා ලදී. ලංකා රජය තායිලන්තයෙන් වාර්ෂිකව සහල් මිලදී ගැනීමට සතුටු බැව් පෙන්වා දුන් අතර, තායිලන්තයට යැවෙන ලංකාවේ තේ හා පොල් නිෂ්පාදිත අපනයන යන් වැඩිවේ යයි බලාපොරොත්තු වන බවද සඳහන් කරන ලදී. ලංකාවට සමහර නිෂ්පාදිත ද්‍රව්‍යයන් අපනයනය කිරීමට තරම් හැකියාවක් ද ඇති බව පෙන්වා දෙන ලදී. ලංකාවෙන් මෙකී ද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සලසනු වස් හැකි සෑම උත්සාහයක්ම දරන බවට තායිලන්ත රජය එකඟ විය.

**මාලදිවයින්**

1965 අගෝස්තු 23 වැනි දින මාලදිවයින් රජයත් සමග වෙළෙඳ සම්මුතියක් ඇතිකර ගන්නා ලදී. මෙය මුලදී 1965 වර්ෂය අවසාන වන තෙක් වලංගු වන අතර, වසරක් පාසා ස්වයංක්‍රීය ලෙස දීර්ඝ වන මෙකී සම්මුතියට අනුව. ප්‍රතිශෝධනය කළ හැකි වූ, ගිවිස ගත් මිලකට උම්බලකඩ නියමිත ප්‍රමාණයක් ලංකා රජයට ලබා දීමට මාලදිවයින් රජය එකඟ විය. නියමිත ප්‍රමාණ වලින් සහල්, තිරිඟු පිටි හා සීනි මිලදී ලබා ගැනීමට මාලදිවයින් රජයට ඉඩ සැලසීමට ලංකා රජය එකඟ විය. විශේෂිත ද්‍රව්‍යයන් මාලදිවයිනට අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ද ලංකා රජය එකඟ විය. මෙකී ද්‍රව්‍ය අපනයනයන්, යැවිය හැකි වූයේ විශේෂිත ප්‍රමාණයකින් හෝ බලපත්‍ර නිකුත් කිරීම පාලනය වන නීති රීති වලට යටත්වය.

**මහජන චීන සමූහාණ්ඩුව**

1962 ඔක්තෝබර් මස 3 වැනි දින මහජන චීන සමූහාණ්ඩුව සමග ඇතිකර ගත් ගිවිසුම අනුව, 1966 වර්ෂය සඳහා භාණ්ඩ හුවමාරු කර ගැනීම පිණිස එකඟත්වයක් 1965 ඔක්තෝබර් මස 12 වැනි දින ඇතිකර ගන්නා ලදී. මෙම එකඟත්වය අනුව රුපියල් කෝටි 12 දක්වා වෙළෙඳම ද්විපාර්ශ්විකව පුළුල් කර ගැනීමට පහසුකම් සැලසුනි. රුපියල් කෝටි 9·6 ක් වටිනා රබර් මෙට්‍රික් ටොන් 41,000ක් මිලදී ගැනීමට චීනය එකඟ වූ අතර, ලංකාව එම ප්‍රමාණයටම වටිනාකමින් යුත් සහල් ටොන් 2,00,000 ක් මිලදී ගැනීමට එකඟ විය.